# වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් සඳහා

# ආචාර ධර්ම පද්ධතියක්

ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ප්‍රකාශනයකි.

වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීමට
කැපවෙමින්
මෙම පොත සිංහලට පරිවර්ථනය කිරීම වෙනුවෙන්
ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය
පිරිනමන
**මාගරීටා ලිසරාගා පදක්කම**
**1999** නොවැම්බර් මස **23** වන දින
ජාතික ධීවර සහයෝගිතාවයට
පිරිනමන ලදී.

වගකීමක් සහිත
ධීවර කර්මාන්තයක් සඳහා

# ආචාර ධර්ම පද්ධතියක්

ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ප්‍රකාශනයකි.

ජාතික ධීවර [illegible]
අංක 85 - කටුවපිටිය පාර,
මීගමුව.

පරිවර්තනය : ජාතික ධීවර සහයෝගිතා කමිටුව
133, කිංසි පාර,
කොළඹ 08.

සංස්කරණය : හර්මන් කුමාර,
වික්ටරින් රොද්‍රිගෝ පැට්‍රික් සොයුරිය

පරිඝණක පිටු සැකසුම : ෂෙහානි පීරිස්

1997 ජුනි 08 දිනට යෙදෙන සාගර දිනය නිමිත්තෙන් ජාතික ධීවර සහයෝගිතා කමිටුවේ ලේකම් කාර්යාංශය මගින් පරිවර්තනය කර මුද්‍රණය කරන ලදී.

This publication was originally issued by the Food and Agricultural organisation of the united nations (FAO) in 1995. This Sinhala transla tion has been prepared by the National Fisheries Solidarity Committee (NAFSOC) and FAO accept no responsibility therefor.

වගකීමක් සහිත

ධීවර කර්මාන්තයක් සඳහා

# ආචාර ධර්ම පද්ධතියක්

ආහාර හා කෘෂිකර්ම සංවිධානය
රෝමය 1995

ප්‍රථම මුද්‍රණය : 1997 ජූනි

ප්‍රකාශනය : ජාතික ධීවර සහයෝගිතා කමිටුව

ISBN NO. 955-9230-10-1

මුද්‍රණය
නව කරුණාධාර මුද්‍රණාලය,
නො.97, මාලිගාකන්ද පාර,
කොළඹ 10.

# ධීවර කර්මාන්තය වගකීමෙන් කලයුත්තේ ඇයි?

ලොවපුරා ධීවර සම්පත් අධික සූරා කෑමට ලක්ව ඇති බව දස දෙසින් නැගෙන හඬයි. අසීමිතව ඇති සම්පතක් සේ දැක ව්‍යාපාරිකයින්ට ධන නිධාන පාද ගැනීමට මං පාදන ධීවර කර්මාන්තයක් මගින් ලොවේ බහුතරයක් මව්වරුන්ට දරුවන්ට, අත් විඳීමට සිදුව ඇති මන්දපෝෂණය, සාගතය, දුර්භික්ෂ ඉතාමත් ඛේදනීය මට්ටමින් වසර 2005 දී සිදුවිය හැකි බවට ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය අනතුරු හඟවයි. ජනතාවගේ ලාභම ප්‍රෝටීන් ප්‍රභවය රැක ගැනීමට නම් එකී සම්පත් නැනවත් පරිහරණයක අවශ්‍යතාවය සියළුම මට්ටම් වලදී පිළිගත යුතුය. නමුත් අද ධීවර සම්පත්හි නැනවත් පරිහරණය අපේක්ෂා කරනුයේ එයම පමණක් ජීවිකාව කරගත් ඉතාමත් දුකසේ ජීවිතය හැඩ ගසා ගන්නා ධීවරයන් සහ ධීවර කාර්මිකයාගෙනුත් පමණක් වීම අභාග්‍යයකි. වසර සිය ගනනක් ධීවර සම්පත් සුරකිමින් තම ජීවිකාවද ගෙන ගිය ධීවර ජනතාව තරගකාරිත්වයට යොමු කර ව්‍යාකූලව භේද භින්න වීමට ඉඩහැර තම අභිප්‍රායන් ඉටුකර ගැනීමට ව්‍යාපාරිකයින්ට මං පාද ගැනීම හා එයට ඉඩදීම ජනතාවගේම අභාග්‍යයකි.

දේශීය හෝ විදේශීය සමාගම් හා ධීවර යාත්‍රා ඝර්ම කලාපික මුහුදු සීමාවන්හිදීත්, තමන් සෞම්‍ය කලාපීය මුහුදේ උපයෝගී කර ගන්නා අධිතාක්ෂණයම උපයෝගී කර ගැනීමෙන් ඝර්ම කලාපීය රටවල මත්ස්‍ය ගහනයන් අධි සූරාකෑමට ලක්ව විනාශවීමේ තර්ජනයට එරෙහිව එම රටවල ධීවර ජනතාව පෙල ගැසෙමින් සිටිති.

සෞම්‍ය කලාපීය මුහුදු සීමාවන්හි ඇති ප්‍රමාණයෙන් අතිශය විශාල මත්ස්‍ය ගහනයන් නෙලා ගැනීමට යොද ගන්නා තාක්ෂණයම, මත්ස්‍ය විශේෂ සංඛ්‍යාත්මකව බහුල වුවත්, මත්ස්‍ය ගහනයන්හි ප්‍රමාණය කුඩා අපේ මුහුදු සීමාවල භාවිතයෙන් අතිශය විනාශයකට මුහුණ පෑමට සිදුවනු ඇත.

මෙය ජෛව විවිධත්වය, පාරිසරික තත්ත්වයන් පිළිබඳව උනන්දුව දක්වන ජනතාව, සංවිධානයන් සලකා බැලිය යුතු වැදගත් කරුණකි.

ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් සකසා ඉදිරිපත් කර ඇති වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් සඳහා ආචාරධර්ම පද්ධතිය මෙම කරුණු පිළිබඳව අවධානය යොමුකර ක්‍රියාත්මක වීම ධීවර කර්මාන්තය පිළිබඳව උනන්දුවන ජනතාවගේ ශක්තියට හේතුවක්ව ඇත. නමුත් ආචාර ධර්ම පද්ධතියේ අරමුණ ලෝක වෙළඳ සංවිධානයේ අවශ්‍යතාවයන්ට යටපත් කිරීමට ඉඩ සැලසේ නම් එය ඉතාමත් ඝානිදයකය. නමුත් මෙම ආචාරධර්ම පද්ධතිය සැකසීමේ උත්සාහය තුල ධීවර කර්මාන්තයේ සුරක්ෂිතභාවය පිළිබඳව ක්‍රියාකාරී වීමේ අවශ්‍යතාව පුළුල් අවධානයකට ලක් කිරීමේ හා එය ශ්‍රී ලාංකික ජනතාව අතර ප්‍රචලිත කිරීමේ අරමුණ ඇතිව මෙම පොත සිංහලට පෙරලා ධීවර සහයෝගිතා කමිටුව මගින් ප්‍රකාශයට පත් කෙරිනි. ඒ සඳහා අවසරය ලබා දුන් ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ප්‍රකාශන අධ්‍යක්ෂ තුමාට සහ මෙම පොත මුද්‍රණය කිරීමට සහය දුන් සැමට අපගේ ස්තුතිය පිරිනමමු.

**හර්මන් කුමාර**
ජාතික ධීවර සහයෝගිතා කමිටුව
97.05.12

# හැඳින්වීම

ජලජ ජීවීන් ඇතුළු ධීවර කටයුතු ජනතාවට පෝෂ්‍යදායී ආහාර වේලක් සපයන අතරම, රැකියා අවස්ථා, විවේකය, වෙළහෙළදම හා ආර්ථික පුනර්ජීවනය උදෙසා හා ලෝකයේ ජනතාවගේ අභිවෘද්ධිය තකා කරන කටයුතු නිසා, වර්තමාන හා අනාගත පරම්පරාවල් ධීවර කර්මාන්තයේ යෙදීමේදී මෙම කාරණා සැලකිල්ලට ගෙන වගකිව යුතු අන්දමින් ඉටුකල යුතුව ඇත. විනයානුකූල හා වගකිව යුතු හුරු පුරුදු අරභයා මෙම පද්ධතියේ ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන් සදගන්ව ඇත. මෙහි අරමුණ වී ඇත්තේ පරිසර පද්ධතිය හා ජීවී විවිධත්වය පූර්ව සැලකිල්ලට ගෙන, සංරක්ෂණය කළමනාකාරිත්වය, හා පවතින ජලජීවී සම්පත් ආරක්ෂා කර ගැනීමට විධි විධාන යෙදීමයි. ධීවර අංශය පිළිබඳ සැලකිල්ලක් දක්වන සියළු දෙනාගේ ඕනෑ එපාකම් හා ධීවර කටයුතු වලට අදල පෝෂණය, සමාජමය, පාරිසරික හා සංස්කෘතික වැදගත්කම මෙම පද්ධතිය හදුනා ගෙන තිබේ. පාරිභෝගිකයන් හා ධීවර අංශයට අදල වෙනත් අයගේ ඕනෑ එපාකම්ද සම්පත්හි ජීව විද්‍යාත්මක ලක්ෂණ හා එහි පාරිසරික වැදගත්කම ගැන ආචාරධර්ම පද්ධතිය හේතු සහිතව කරුණු දක්වා ඇත. ධීවර කටයුතු වල නියැලී සිටින සෑම දෙනා හා රාජ්‍යයන්ද මෙම පද්ධතිය ව්‍යවහාරයට ගෙන ක්‍රියාත්මක කරන ලෙසට ඉල්ලා සිටිමු.

# 1 වෙනි වගන්තිය
# ආචාර ධර්ම පද්ධතියේ ස්වභාවය හා අවකාශ

1.1 මෙම පද්ධතිය ස්වේච්ඡා සහගතයි. කෙසේ වෙතත් ඉන් සමහර කොටස් පදනම් වී ඇත්තේ එක්සත් ජාතීන්ගේ සාගර නීති සම්මුතියේ මුලින් දක්වා ඇති නීති හා ජාත්‍යන්තර නීතියද පදනම් කර ගෙනයි. පාර්ශව අතරේ වෙනත් පිළිපැදිය යුතු නීතිමය ලියවිලි සඳහා සබැඳීමේ ප්‍රතිපලයක් ඇති කර ගත හැකි හෝ දැනටමත් එසේ විය හැකි අන්දමේ විධිවිධාන මෙම පද්ධතියේ ද අඩංගුවේ. උදාහරණයක් වශයෙන් FAO සම්මේලනයේ යෝජනාවකට අනුව (15/93 ඡේදය ) මහා සාගරයේ ධීවර යාත්‍රා මගින් පිළිපැදිය යුතු ජාත්‍යන්තර සංරක්ෂණ හා කළමනාකරණ පියවර සඳහා 1993 අත්සන් තබන ලද ගිවිසුමේ විධිවිධාන ද මෙයට ඇතුලත් වේ.

1.2 මෙම පද්ධතියේ අවකාශයන් මුළු ලෝකයටම බලපාන අතර, එය යොමු කර ඇත්තේ FAO සංවිධානයේ සාමාජික හා සාමාජික නොවන අයටත්, රාජ්‍ය හෝ රාජ්‍ය නොවන කලාපීය, උප කලාපීය හෝ ජාත්‍යන්තර සංවිධාන වලටත්, ධීවර සම්පත් සංරක්ෂණයේ නියැලී සිටින සෑම දෙනාටමත්, ධීවර කටයුතු සංවර්ධනයේ හා කළමනාකාරත්වයෙහි යෙදෙන්නන්ටත්, කර්මාන්තයට අදාල කාර්මිකයින්ටත්, මත්ස්‍ය නිෂ්පාදන හා මසුන් ඇලෙවි කරන්නන්ටත්, ධීවර කර්මාන්තයට සම්බන්ධව ජලජීවී පරිසරය භාවිතා කරන්නන්ටත් මේ පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීම උදෙසාය.

1.3 ධීවර කටයුතු සංවර්ධනයට, කළමනාකාරත්වයට හා සංරක්ෂණයට අදාල වන පරිදි මූලධර්ම හා ප්‍රමිතීන් සඳහා මෙම ආචාර ධර්ම පද්ධතියෙහි ඉඩ සලසා ඇත. තවද මසුන් ඇල්ලීම, සැකසීම, මසුන් හා මත්ස්‍ය නිෂ්පාදනය වෙළඳාම, ධීවර මෙහෙයුම්, ජලජ ජීවීන් ,ධීවර පර්යේෂණ හා වෙරළබඩ පෙදෙස් කළමනාකාරිත්වයට ධීවර කටයුතු සම්බන්ධ කිරීම යන කරුණු සියල්ලද මින් ආවරණය වේ.

1.4 මෙම ආචාරධර්ම පද්ධතියේ රාජ්‍යයන් යටතට යුරෝපීය ප්‍රජාවද ඇතුළත් වන අතර, ධීවර යනුවෙන් අදහස් කරනුයේ මසුන් ඇල්ලීම සහ ජලජීවී වගාව යන ආකාරයන් දෙකටමය.

## 2 වන වගන්තිය
## ආචාරධර්ම පද්ධතියේ අරමුණු

**මෙහි අරමුණු වශයෙන් දැක්විය හැක්කේ :**

A. ජෛව විද්‍යාත්මක, තාක්ෂණික සමාජමය, ආර්ථික, පාරිසරික හා වානිජ්‍යමය පාර්ශවයන් සැලකිල්ලට ගෙන වගකිව යුතු මසුන් මැරීමේ හා ධීවර කටයුතු වලට අදාල ජාත්‍යන්තර නීතියට අනුකූල පරිදි මූලධර්ම හා ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම.

B. වගකිව යුතු ධීවර සම්පත් සංවර්ධනයට හා මත්ස්‍ය ධීවර සම්පත් සංරක්ෂණයට, කළමනාකාරීත්වයට හා සංවර්ධනය උදෙසා ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා ඔප් නැංවීමට ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට.

C. ඔබින උපාය මාර්ගයන් සකසා ක්‍රියාත්මක කිරීම හා වගකිව යුතු ධීවර කටයුතුවල යෙදීමේදී අවශ්‍ය වන ආයතනික හා නීතිමය රාමුව වර්ධනයට හෝ ස්ථාපනයට ධීවර කටයුතුවල යෙදෙන රාජ්‍යයන්ට උදව් දීම සඳහා තොරතුරු ලබා ගැනීමට පදනම් කර ගත හැකි ලියවිල්ලක් ලෙස උපයෝගී කර ගැනීමට.

D. සුදුසු අවස්ථාවන්හිදී ජාත්‍යන්තර ගිවිසුම් හා වෙනත් නීතිමය ලිපි ලේඛන සැකසීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය මඟ පෙන්වීම හා උපදෙස් ලබාදීම; මෙවන් උපදෙස් පිළිපැදිය යුත්තේ ස්වේච්ඡාවෙනි.

E. ධීවර කළමනාකාරීත්වයේ හා සංවර්ධනයේ දී මෙන්ම ධීවර සම්පත් සංරක්ෂණයේදී තාක්ෂණික මූල්‍යමය හා වෙනත් අයුරින් සහයෝගය දැක්වීම පහසු කරවීම හා වර්ධනය කිරීමට,

F. දේශීය ප්‍රජාවගේ පෝෂණ අවශ්‍යතා සඳහා මුල්තැන දෙමින් ආහාර සුරක්ෂිතභාවයට හා ආහාරයේ ගුණාත්මකභාවයට ධීවර කටයුතුවල දායකත්වය වැඩි දියුණු කිරීමට,

G. ජීවී ජලජ සම්පත් හා උන්ගේ ජලජීවී පරිසරයත් වෙරළාසන්න ප්‍රදේශත් ආරක්ෂා කොට දියුණු කිරීමට,

H. අදාල ජාත්‍යන්තර නීතියට අනුකූලව ධීවර නිෂ්පාදන වෙළදාම දියුණු කිරීම හා එවන් වෙළදාමට අවහිර වන අන්දමේ සැහවී ඇති බාධක මහ හැරීමට,

I. ධීවර පර්යේෂණ හා ඊට සම්බන්ධ පරිසර පද්ධතිය හා අදාල පාරිසරික සාධක දියුණුවට සහ,

J. ධීවර කටයුතු වල නිරතවී සිටින්නන් අතරේ සම්මත විනය ප්‍රමිතීන් වර්ධනය කිරීමට.

## 3 වන වගන්තිය
## වෙනත් ජාත්‍යන්තර ගිවිසුම් හා
## පැවැත්විය යුතු සබඳතාවය

3.1 1982 වසරේ එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතියේ දැක්වෙන පරිදි , මෙම පද්ධතිය අර්ථකථනය කළ යුත්තේ හා නීති යොදා ගත යුත්තේ අදාල ජාත්‍යන්තර නීති හා එකාබද්ධවය. ජාත්‍යන්තර නීතියේ ගිවිසුම් වල දක්වා ඇති පරිදි රාජ්‍යයන්ට අදාල සාගර සීමාවන් , වගකීම් හා අයිතීන් (හිමිකම්) වලට මෙම පද්ධතියෙන් කිසිදු බාධාවක් නොවිය යුතුය.

3.2 (අ) මෙම පද්ධතිය අර්ථකථනය කොට උපයෝගී කර ගත යුත්තේ අධි සංක්‍රමනික මත්ස්‍ය සම්පත් හා නිජබිම් හැර යන මත්ස්‍ය සම්පත් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ 1982 දෙසැම්බර් 10 දින සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ ගිවිසුමේ එකඟතාවලට අනුකූලවය.

(ආ) තමන් පාර්ශවයක් වූ ජාත්‍යන්තර ගිවිසුම් ප්‍රකාරව එක් එක් රාජ්‍යයන්ට වෙන් වෙන් ව ඇති යුතුකම් ඇතුළුව, වෙනත් ව්‍යවහාරික ජාත්‍යන්තර නීතීන්ට අනුකූලවෙත් සහ,

(ඇ) 1992 වසරේ කැන්කූන් (Cancun) ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි හා 1992 වසරේ එක්සත් ජාතීන්ගේ පාරිසරික හා සංවර්ධන සම්මේලනයේ (UNCED) රියෝ ප්‍රකාශනය හා 21 වෙනි වැඩ සටහනේ විශේෂයෙන් 17 වෙනි ඡේදයේ (Chapter 17 of Agenda 21) හා වෙනත් ප්‍රකාශන හා ජාත්‍යන්තර ලියකියවිලි වලට අදාලවය.

## 4 වෙනි වගන්තිය
## පද්ධතිය ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා නවීකරණය

4.1 ආහාර හා කෘෂිකර්ම (FAO) සංවිධානයේ සියලු සාමාජිකයන් හා සාමාජික නොවන්නන්, ධීවරයන් වෙනුවෙන් ක්‍රියාකරන අදාල උප කලාපීය, කලාපීය සහ ජාත්‍යන්තර සංවිධානයන්, ඒවා රජයේ සංවිධාන හෝ රාජ්‍ය නොවන සංවිධාන වුවත්, සංරක්ෂණයේ හා ධීවර සම්පත් කළමනාකාරිත්වයේ යෙදී සිටින හා මත්ස්‍ය සහ ධීවර නිෂ්පාදන වෙළදාමේ යෙදී සිටින සැම දෙනාම පද්ධතියේ දක්වා ඇති අරමුණු හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා ඉෂ්ට කිරීමේ ලා සහයෝගීතාවය දැක්විය යුතුවේ.

4.2 එක්සත් ජාතීන්ගේ සංවිධානය තුල (FAO) ආහාර හා කෘෂිකර්ම සංවිධානය තමන්ගේ භූමිකාව අනුව පද්ධතිය ක්‍රියාත්මක කිරීම හා උපයෝගී කර ගැනීම ගැන අධීක්ෂණය කරමින් ධීවර කටයුතු සඳහා බලපාන අන්දම පිළිබඳව ලේකම් කාර්යාංශයට දැන්වුවාට පසු එම කාර්යාංශය ඒ පිළිබඳ ධීවර කමිටුවට (COFI) වාර්තා කරනු ඇත. සියලු රාජ්‍යයන්, (සාමාජික හා සාමාජික නොවන) හා අදාල ජාත්‍යන්තර සංවිධාන රජයේ හෝ රජයේ

නොවන සංවිධාන උවද මෙම කාර්යයේදී (FAO) ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමඟ ක්‍රියාකාරීව හා සහයෝගයෙන් කටයුතු කළ යුතුවේ.

4.3 ආහාර හා කෘෂිකර්ම (FAO) සංවිධානය ඊට අදාළ සංගම් ආශ්‍රයෙන් ආචාර ධර්ම පද්ධතිය පුනර්ක්ෂණය කළ හැකිය. මෙහිදී සැලකිල්ලට භාජනය කළ යුත්තේ ධීවර කර්මාන්තයේ සංවර්ධනය හා ආචාර ධර්ම පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ධීවර කමිටුවෙන් (COFI) ලැබී ඇති වාර්තාවන්ය.

4.4 රාජ්‍යයන් හා ජාත්‍යන්තර සංවිධාන, රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානයන්ද ඇතුළුව ධීවර කටයුතු වල නියැලී සිටින්නන් අතර පද්ධතිය අවබෝධ කර ගැනීමට උනන්දු කරවිය යුතුය. ප්‍රායෝගික අවස්ථාවන් හිදී ස්වේච්ඡාවෙන් පද්ධතිය පිළිගැනීම හා එය ප්‍රබලව යොදා ගැනීම උදෙසා ව්‍යාපාර හඳුන්වා දිය යුතුය.

## 5 වගන්තිය
## සංවර්ධනය වෙමින් පවතින රටවලට ආචාර ධර්ම පද්ධතියේ භාවිතය.

5.1 සංවර්ධනය වෙමින් පවතින රටවලට මෙම පද්ධතියේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව නිවැරදිව සැලකිල්ලට ගත යුතුය.

5.2 මෙම පද්ධතියේ අරමුණු ඉටු කර ගැනීමට හා එය කාර්යක්ෂමව ක්‍රියාත්මක කර වීමට ආධාරකයක් වශයෙන් රාජ්‍යයන්, අදාළ ජාත්‍යන්තර සංවිධාන (රාජ්‍ය හෝ රාජ්‍ය නොවන) හා මූල්‍ය ආයතන සංවර්ධනය වෙමින් පවතින රටවල විශේෂිත තත්ත්වයන් හා අවශ්‍යතා සඳහා (විශේෂයෙන්ම කුඩා දිවයින් රාජ්‍ය හා ඌන සංවර්ධිත රාජ්‍යයන්ට අදාළ ප්‍රාග්ධන ආයතන හා මූල්‍ය ආයතන සහ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන ) සංවර්ධනය වෙමින් පවතින රටවල අවශ්‍යතා සපුරාලීමට ක්‍රියා මාර්ග යොදා ගත යුතුවා සේම,

විශේෂයෙන්ම මූල්‍යමය හා තාක්ෂණ සහයෝගය, තාක්ෂණ හුවමාරුව, පුහුණුව හා විද්‍යාත්මක සහයෝගය ලබාදීම උදෙසා ඇපකැපවී වැඩ කළ යුතුය. මෙහිදී විශේෂයෙන්ම තම ධීවර කටයුතු වැඩි දියුණු කර ගැනීමටත්, ගැඹුරු මුහුදේ ධීවර කටයුතු සඳහා සහභාගිත්වයටත්, එවන් ධීවර කටයුතු සඳහා ප්‍රවේශ මාර්ගයක් සැකසීම සඳහාත් උපකාර කළ යුතුය.

## 6 වගන්තිය

## පොදු ප්‍රතිපත්ති

6.1 රාජ්‍යයන් හා සජීවී ජලජ සම්පත් භාවිතා කරන්නන්, ජලජීවී පරිසර පද්ධතිය සංරක්ෂණය කළ යුතුය. මසුන් මැරීමේ අයිතිය හා සබැඳි, එය වගකිව යුතු අන්දමින් ඉටු කරන ප්‍රබල, සංරක්ෂණ හා ජලජීවී සම්පත් කළමනාකාරිත්වයක්, ඒ මඟින් ඇති කරලීම සහතික කිරීම , අත්‍යවශ්‍යය.

6.2 ධරණීය සංවර්ධනය, දිළිඳුකම තුරන් කිරීම හා වර්තමාන හා අනාගත පරපුර උදෙසා ආහාර සුරක්ෂිතභාවය විශේෂයෙන් ආහාරයට ගන්නා මසුන් ලබාදීම වැනි කරුණු ගැන ධීවර කළමනාකාරිත්වයේදී වැඩියෙන්ම උනන්දු විය යුතුය. මෙහිදී මත්ස්‍යයන්ගේ තත්වය, විවිධත්වය හා බහුලව ධීවර සම්පත ලබාදීම ගැන විශේෂයෙන් සැලකිලිමත් විය යුතු වේ. කළමනාකාරිත්ව නියමයන් ඉලක්ක මත්ස්‍ය වර්ග සංරක්ෂණය සහතික කළ යුතුවා පමණක් නොව, එකම පරිසර පද්ධතියේ වෙසෙන වෙනත් වර්ගයේ මසුන්ද, (ඉලක්ක වර්ගයන් ගෙන් යැපෙන මසුන් හෝ ඊට සම්බන්ධ) සංරක්ෂණය කළ යුතු වේ.

6.3 රාජ්‍යයන් මඟින් අධික ලෙස මත්ස්‍ය සම්පත් සූරා කෑමත්, අධි ප්‍රාග්ධන ආයෝජනයන් මඟින් වැඩිපුර මසුන් ඇල්ලීමේ ධාරිතාවයන් වැනි ක්‍රියාමාර්ග ගැනීමේ සිරිත් වළක්වාලිය යුතුය. ඒ සමඟම කළමනාකාරිත්ව පියවර මඟින් ධරනීය නිෂ්පාදන ධාරිතාවය නොඉක්මවා යාම සඳහා, මත්ස්‍ය සම්පත

ඔරොත්තු දෙන පමණින් ලබා ගැනීම සිදුකල යුතු වේ. අවශ්‍යතාවය පරිදි හා අවශ්‍ය විටදී හැකිතාක් දුරට මත්ස්‍ය ගහනය වර්ධනය තුළින් පුනරුත්ථාපනය කිරීමට අදාළ රාජ්‍යයන් පියවර ගත යුතුය.

6.4 ධීවර කටයුතු සංරක්ෂණය හා කළමනාකාරිත්වය උදෙසා තීරණ ගත යුත්තේ ප්‍රබල විද්‍යාණුකූල සාක්ෂි පදනම් කර ගෙනයි. මේ සඳහා සම්පත් පිළිබඳව පාරම්පරික දැනුම අවබෝධය, මසුන්ගේ නිජ බිම් සහ අදාළ පාරිසරික ආර්ථික හා සම්ප්‍රදායික සමාජය සාධකද සැලකිල්ලට භාජනය කල යුතුව ඇත. ධීවර කටයුතු හා පරිසර පද්ධතියේ අන්තර් ක්‍රියාකාරිත්වයද ඇතුළු තාක්ෂණික හා විද්‍යාත්මක දැනුම වර්ධනය උදෙසා අධ්‍යයන , පර්යේෂණ හා දත්ත රැස් කිරීමට රාජ්‍යයන් ප්‍රමුඛත්වය දිය යුතුය. බොහෝ ජලජීවී පරිසර පද්ධතීන් රාජ්‍ය සීමාවන් (දේශ සීමා ) අභිභවා යන ස්වභාවය ගැන සැලකිල්ලට ගෙන අවශ්‍ය පරිදි (යෝග්‍ය විටදී) රාජ්‍යයන් ද්වි පාර්ශවීක හා බහුපාර්ශවීක සහයෝගිතාවය දිරිගැන්වීමට පියවර ගත යුතුය.

6.5 විද්‍යානුකූලව ලබාගත හැකි උපරිම සාක්ෂි සැලකිල්ලට ගෙන රාජ්‍යයන්, උප කලාපීය හා කලාපීය ධීවර කළමනාකාරිත්ව සංවිධානයන් ජලජජීවී පරිසර පද්ධතිය කළමනාකරණය හා ධීවර සම්පත් සංරක්ෂණයෙහිලා පූර්ව ආරක්ෂක උපක්‍රම අනුගමනයට කටයුතු කිරීම කල යුතුය. ප්‍රමාණවත් විද්‍යානුකූල සාක්ෂි හා දත්ත නොමැතිකම ඉලක්ක මත්ස්‍ය වර්ග හෝ ඔවුන්මත යැපෙන මත්ස්‍ය වර්ග, ඉලක්ක වර්ග හා ඉලක්ක නොවන වර්ග සහ උන්ගේ පරිසරය සංරක්ෂණය උදෙසා පියවර නොගෙනීමට හෝ පියවර ගැනීම අතපසු කිරීම සඳහා කිසිසේත්ම හේතුවක් කර ගතයුතු නොවේ.

6.6 තෝරාගත් හා පරිසරයට හානිදායක නොවන ප්‍රවේශම් සහිත මසුන් ඇල්ලීමේ උපකරණ කට්ටල හා ක්‍රම වඩාත් සංවර්ධනය කරමින් යෝග්‍යතාවය අනුව භාවිතා කල යුතුය. මෙය අදාල වන්නේ ජෛවීය විවිධත්වය පවත්වා ගැනීමට, ජීව ව්‍යුහය හා ජලජීවී පරිසර පද්ධතිය හා මාළුන්ගේ ගුණාත්මක භාවය ආරක්ෂාව සඳහාය. සුදුසු පරිදි තෝරාගත්, පරිසරයේ ආරක්ෂා සහිතව මසුන් ඇල්ලීමේ උපකරන කට්ටල හා ක්‍රම විධි

යොදා තිබේද යන්නත්, හඳුනා ගෙන, ධීවර කර්මාන්තයට අදාළ සංරක්ෂණ හා කළමනාකාරීත්ව පියවර ගැනීම උදෙසා ප්‍රමුඛත්වයක් දිය යුතුවේ. රාජ්‍යයන් සහ ජලජීවී පරිසර පද්ධතිය භාවිතා කරන වෙනත් අය, හැකිතාක් දුරට සම්පත් නාස්තිය අවම කළ යුතු අතර ඉලක්ක නොවන විශේෂ (මත්ස්‍ය සහ මත්ස්‍ය නොවන ) හා ඔවුන් ආශ්‍රිත හෝ ඔවුන් මත යැපෙන විශේෂ ඇල්ලීම අවමය පිළිබඳවද අවධානය යොමු කළ යුතුය.

6. 7 අස්වනු නෙළීම, පිළියෙල කොට සැකසීම හා මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන බෙදා හැරීම කළ යුතුව ඇත්තේ මත්ස්‍යයින්ගේ පෝෂණ ගුණය, ගුණාත්මක භාවය සහ ආරක්ෂාකාරී බව පවත්වා ගත හැකි අන්දමටත්, එමගින් නාස්තිය අවම කොට පරිසරයට සිදුවිය හැකි අහිතකර බලපෑම් අඩුකර ගැනීමටත්ය.

6.8 හැකියාව හා අවශ්‍යතාවය අනුව කරදිය හා මිරිදිය පරිසර පද්ධතීන්ගේ අවදානම් වලට ලක්වී ඇති මත්ස්‍ය ජනාවාස ආරක්ෂා කොට හැකිතාක් දුරට පුනරුත්ථාපනය කර ගත යුතුය. මෙයට අඩංගුවිය යුත්තේ කරදියේ හා මිරිදියේ අඩංගු තෙත්බිම්, කඩොලාන බිම්, ගල්පර, කලපු, තවාන්, ප්‍රජනක පෙදෙස් වැනි අවදානම් මත්ස්‍ය ජනාවාසයි. ඒවා විනාශ මුඛයට යා නොදී රැක ගැනීමට, තත්වයෙන් බාල වීමට , දූෂණය හෝ අපවිත්‍ර වීමට හා වෙනත් මානව කටයුතු හේතුවෙන් එකී ධීවර සම්පත්වල සෞඛ්‍යයට හා පැවැත්මට සිදුවිය හැකි හානි වලක්වා ලීමට විශේෂිත උත්සාහයක යෙදිය යුතුවේ.

6.9 වෙරළ කලාපයේ බහුවිධ උපයෝගීතාවය හා ඒකාබද්ධ වෙරළකලාප පෙදෙස් කළමනාකාරීත්වයේදී, සැලසුම් සැකසීමේදී හා සංවර්ධන ක්‍රියාමාර්ග ආශ්‍රිත විවිධ කටයුතු දියත් කිරීමේදී, ධීවර ඕනෑ එපාකම්ද රාජ්‍යයන් විසින් සහතික කල යුතු අතරම, සම්පත් සංරක්ෂණයේ අවශ්‍යතාවයද සිත තබා ගත යුතුය.

6.10 තම බලප්‍රදේශයන් හිදී හා ජාත්‍යන්තර නීතියට අනුකූලව සහ උපකලාපීය හා කලාපීය ධීවර සංරක්ෂණ හා කළමනාකාරිත්ව සංවිධාන හා වැඩ පිළිවෙලවල් ඇතුලත හෝ බාහිරව සුදුසු පරිදි ධීවර යාත්‍රා හා සහායක යාත්‍රා, සංරක්ෂණ හා කළමනාකාරිත්ව පියවරයන්ට අනුකූලව කටයුතු කරන්නේද යන්න කියාත් පාලනයට හා සුපරීක්ෂාවට ප්‍රබල ක්‍රියාකාරී ක්‍රම ඇති කිරීමත් අදාළ රාජ්‍යයන් සතු කාර්යයන් වේ.

6.11 ධීවර හා ධීවර සහාය යාත්‍රාවන්ට තම ධජය නැංවීමට අවසර ලබාදෙන රාජ්‍යයන් එකී යාත්‍රා කෙරෙහි ප්‍රබල පාලනයක් ඇති කළ යුත්තේ මෙම ආචාර ධර්ම පද්ධතිය නිසි පරිදි ව්‍යවහාර කරන්ද යන්න සහතික කරනු උදෙසාය. ජාත්‍යන්තර, කලාපීය, උපකලාපීය හා ජාතික මට්ටමින් අනුමත කරගත් හා ජාත්‍යන්තර නීතියට අනුකූලව යොදා ඇති සංරක්ෂණ හා කළමනාකාරිත්ව පියවරයන්ගේ ප්‍රබලතාවය හීන කරලීමේ කටයුතුවල එම යාත්‍රා නොයෙදෙන බවට එවන් රාජ්‍යයන් වග බලා ගත යුතුය. තම ධජය ලෙල දෙන සෑම යාත්‍රාවක්ම ඔවුන්ගේ ධීවර කටයුතුවලට අදාළ දත්ත එකතු කිරීමේදී හා ඒවා ලබාදීමේදී තම වගකීම් නිසියාකාරව ඉෂ්ට කරන්ද කියා මැනවින් සොයා බැලීම, එකී රාජ්‍යයන් සතු කාර්යයකි.

6.12 සෑම රාජ්‍යයක්ම , තමන්ට ආවේනිකවූ ප්‍රදේශයන්හි, ජාත්‍යන්තර නීතියට අනුකූලව , උප කලාපීය, කලාපීය හා ජාත්‍යන්තර මට්ටමින් ධීවර කළමනාකාරිත්ව සංවිධාන ඇසුරින් හා වෙනත් ජාත්‍යන්තර ගිවිසුම් වලට අනුකූලව සංරක්ෂණය හා කළමනාකාරිත්වය උනන්දු කරවිය යුතුය. මෙහි අභිලාශය වන්නේ වගකිව යුතු අන්දමට ධීවර කටයුතු වල යෙදීමත්, ප්‍රබල සංරක්ෂණ ක්‍රම අනුගමනය කරමින් සජීවී ජලජ සම්පත් ආරක්ෂා කරමින් ඊට අනුරූපවූ ක්‍රියාමාර්ග, තම ජාතික බල ප්‍රදේශයේ බාහිරවත්, අභ්‍යන්තරවත්, සුදුසු පරිදි ඉටු වේද යන්න කියා තහවුරු කර ගැනීමත් සඳහාය.

6.13 තම ජාතික නීතියෙන් අවකාශ සළසා ඇති පරිදි, තීරණ ගැන්මේ ක්‍රියාවලියේ විනිවිද භාවය තුලත්, හදිසි ගැටළු විසඳීම උදෙසා කලට වේලාවට කටයුතු කල හැකි බවටත් , රාජ්‍යයන් සහතික කළ යුතු වේ. එමෙන්ම රාජ්‍යයන් යෝග්‍ය ක්‍රියාවලින් තුලින් ධීවර කර්මාන්තයට අදාළ ධීවරයින්ගේ පරිසර සංවිධාන, ධීවර සංවිධාන ආදී උනන්දුව දක්වන සියල්ලන්ගේ උපදේශාත්මක හා ප්‍රබල සහභාගිත්වය සැලකිල්ලට ගෙන ධීවර කළමනාකාරිත්වයට අදාළ නීති හා ප්‍රතිපත්ති සැකසීමට හා සංවර්ධනයටත් ජාත්‍යන්තර ණය හා ආධාර දීමේ වැඩ සටහන් උදෙසා කටයුතු යොදා ගැනීමට පහසුකම් සළසාදිය යුතුව ඇත.

6.14 ජාත්‍යන්තර මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වෙළඳාම කළයුත්තේ ලෝක වෙළඳ සංවිධානයේ (WTO) මූලධර්ම, අයිතීන් හා අවශ්‍යතාවය අනුව සැකසුනු එකඟතාවයන්ට හා වෙනත් ජාත්‍යන්තර ගිවිසුම් ප්‍රකාරව ඒවායේ නීති තීරණ හා නිර්දේශ අනුවයි. තම ප්‍රතිපත්ති වැඩ සටහන් හා ක්‍රියාකාරීත්වයන් මත්ස්‍ය නිෂ්පාදන වෙළඳාමට බාධාවක් හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳාමට පාරිසරික විනාශයට හෝ පෝෂණ බලපෑම් ද ඇතුළු සමාජ්‍ය වශයෙන් අහිතකර ප්‍රතිඵල ඇති නොවීමට වගබලා ගැනීම රාජ්‍යයන් සතු වගකීමකි.

6.15 ගැටුම් හා අර්බුදකාරී තත්වයන් වලකාලීමට රජයන් කටයුතු කළ යුතුය. ව්‍යාවහාරික ජාත්‍යන්තර ගිවිසුම්වලට අනුකූලව හෝ නොඑසේ නම් පාර්ශවයන් අතරේ එකඟත්වයකට එළඹීමකින් ධීවර කටයුතු හා සබැදී අරගල , ආරවුල් හා ක්‍රියා පිළිවෙත් සාමකාමී හා සහයෝගී ආකාරයෙන් විසඳාගත යුතුය.

6.16 අර්බුධයන්හිදී අදාළ රජයන් එළඹෙන තාවකාලික එකඟතාවයන් ගැටළු නිරාකරන ක්‍රියාවලියේ අවසන් ප්‍රතිඵලයට බලපෑමක් (අහිතකර) නොවනසේ විය යුතුයි. තමන් යැපෙන්නාවූ ධීවර සම්පත් සංරක්ෂණය හා කළමනාකාරිත්වය පිළිබඳ අවබෝධයක් ධීවරයිනට ලබාදීමේ වැදගත්කම

හඳුනාගත් රාජ්‍යයන්, වගකිව යුතු ධීවර කටයුතු පිළිබඳ අවබෝධය පුහුණු හා අධ්‍යාපන ක්‍රම මගින් ලබාදිය යුතු වේ. ඒ අතරම, මෙම ආචාර ධර්ම පද්ධතිය ක්‍රියාවට නැංවීම පහසුවන පරිදි ප්‍රතිපත්ති සැකසීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට ධීවර ජනයා එකතුකර ගැනීම සහතික කළ යුතුය.

6.17 ධීවර පහසුකම් හා උපකරණ ඇතුළුව සෑම ධීවර කටයුත්තක්ම ධීවරයාට ප්‍රවේශම් කාරීවත්, සෞඛ්‍ය සම්පන්න හා සාධාරණව වැඩ කිරීමේ හා ජීවත්වීමේ තත්ත්වය ලබාදී තිබේ දැයි රාජ්‍යයන් සහතික විය යුතුය. ඒ සමගම එම කොන්දේසි අදාළ ජාත්‍යන්තර සංවිධානයන් ගෙන් උපුටාගත් ජාත්‍යන්තරව එකඟත්වයට පැමිනි ඒවා විය යුතුය.

6.18 රැකියාවට , ආදායමට හා ආහාර සුරක්ෂිතභාවයට සුළුපන්න හා සම්ප්‍රදායික ධීවර කටයුතු ලබාදෙන වැදගත් දායකත්වය හඳුනාගෙන අදාළ රාජ්‍යයන් සුළුපන්න හා සම්ප්‍රදායික ධීවර ජනයාගේ අයිතිවාසිකම් රැකීම සඳහාත් ඔවුන්ට සුරක්ෂිතව හා සාධාරණව දිවි පෙවෙත ගෙවීමටත්, පාරම්පරික ධීවර බිම් හා සම්පත් සඳහා තම මනාපය පරිදි ප්‍රවිශ්ඨ වීමට මං සළසා දීමට අදාළ පරිදි පියවර ගත යුතුය.

6.19 ජලජීවී වගාව සහ වගාව පදනම් කරගත් ධීවර කටයුතු, ආදායම හා ආහාර විවිධාංගීකරනයේ වර්ධනය කරන මාර්ගයක් ලෙස රජයයන් හඳුනා ගත යුතුය. මෙම කටයුත්ත කිරීමේදී සම්පත් වගකීමෙන් භාවිතා කිරීම සහ පරිසරයට හා ප්‍රාදේශීය ප්‍රජාවන්ට ඇතිකරන අහිතකර බලපෑම අවම කිරීම සහතික කිරීමද රජය විසින් කළ යුතුය.

## 7 වෙනි වගන්තිය - ධීවර කළමනාකාරිත්වය

7.1 සාමාන්‍ය

7.1.1 රාජ්‍යයන් හා ධීවර කළමනාකරණ කටයුතු වල නියැලී සිටින්නන්, නීතිමය හා ආයතන යෝග්‍ය ප්‍රතිපත්ති රාමුවක් සැකසීම තුළින් ධරණීය මට්ටමින් දිගු කාලීනව ධීවර සම්පත් නෙලා ගැනීමටත්, එය වර්තමාන හා අනාගත පරම්පරාවන් උදෙසා ද එලෙසට ලැබිවිය යන සත්‍යයතාවයට සහතික විය යුතුය. සංරක්ෂණ හා කළමනාකරණ විධිවිධාන (ප්‍රාදේශීය, ජාතික, කලාපීය ජාත්‍යන්තර ) විද්‍යාත්මක දත්ත මත පදනම්ව දිගුකාලීන ධරණීය ධීවර සම්පත් භාවිතා කිරීම සඳහා වන සැලැසුම් කිරීමට යොදා ගත යුතුය.

ප්‍රාදේශීය, දේශීය, උපකලාපීය හෝ කලාපීය මට්ටමින් වන සැලැසුම් දිගු කාලීන අරමුණු සඳහා පදනම් කරගත යුතු වන අතර එයින් ධීවර සම්පතේ පැවැත්ම ප්‍රමාණවත් භාවිතයට සීමා කරන අතර, කෙටි කාලීණ අවශ්‍යතාවන්හිදී මෙම අරමුණු නොසලකා හැරිය යුත්තේ නොවේ.

7.1.2 තම ජාතික බල ප්‍රදේශයට අයත් ප්‍රදේශයන්හි ධීවර සම්පත් භාවිතය හා කළමණාකාරිත්වයට උනන්දු වන කණ්ඩායම් (නීත්‍යානුකූල පිළිගැනීම සහිත) හඳුනාගෙන ඒ පිළිබඳව උනන්දුවක් දක්වන සියලුම පාර්ශවයන් හා සාකච්ඡා කළ යුතුය. මෙහි අරමුණ ඔවුන්ගේ සහායද ලබාගෙන ධීවර කටයුතු වගකිව යුතු අන්දමට පවත්වාගෙන යාමයි.

7.1.3 ඉහල සංක්‍රමණික මත්ස්‍ය විශේෂ, ධීවර බිම් හැර යන මත්ස්‍ය විශේෂ හා ගැඹුරු මුහුදේ මත්ස්‍ය ගහනයන් රාජ්‍යයන් දෙකක් හෝ එයට වැඩි ගණනක් භාවිතා කරන විටදී අදාල රාජ්‍යයන් විශේෂයෙන්ම වෙරළ රාජ්‍යයන්ද ඇතුළුව කාර්යක්ෂමව සම්පත් කළමනාකරණයට හා සංරක්ෂණයට සහයෝගය දැක්වීම සහතික විය යුතුය. මෙය ද්විපාර්ශවික හෝ බහුපාර්ශ්වික ධීවර සංවිධාන ගොඩනැගීමෙන් හෝ එවැනි එකඟතාවයන්ට පැමිණීමෙන් ළඟාකර ගත යුතුය.

7.1.4 යෝග්‍ය පරිදි උපකලාපීය හෝ කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන වලට එවන් සම්පත් ඇති රාජ්‍යයන්හි නියෝජිතයින් සඳහා විධිවිධාන සැලසිය යුතුය. එසේ නොමැති නම්, සංරක්ෂණ හා කළමනාකරණ කටයුතු පිළිබඳ උනන්දුවන නියෝජිතයිනට සහභාගිවීමට ඉඩ සලසා, ගැඹුරු සාගරයේ හෝ වෙනත් ජාත්‍යන්තර මුහුදු තීරයන්හි ධීවර සම්පත් වර්ධනයට රැකුලක් ලබාදිය යුතුය. සම්පත් ප්‍රබල ලෙස සංරක්ෂණයට හා කළමනාකරණය උදෙසා රාජ්‍යයන්ද ක්‍රියාකාරීව සහාය වී මෙයට ආධාර කළ යුතුවේ.

7.1.5 රාජ්‍යයන්, උපකලාපීය හෝ කලාපීය ධීවර කළමනාකරණ අධිකාරියක සාමාජික නොවන විටදී හෝ එහි කටයුතු සඳහා සහභාගි නොවේ නම්, එවන් රාජ්‍යයන්ද හසුරුවන සම්පත් හෝ අධිකාරියේ ක්‍රියාකාරීත්වයට යටත්වන ධීවර සම්පත් පිළිබඳ යොදාගන්නා සංරක්ෂණ හා කළමනාකරණ වැඩ සටහන් ක්‍රියාවට නැංවීම සඳහා සහාය වීමට බැඳී ඇත.

7.1.6 කලාපීය හෝ උපකලාපීය ධීවර කළමනාකරණ සංවිධානයන්හි (රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධාන) නියෝජිතයන්ට රැස්වීම් සඳහා නිරීක්ෂණ හෝ එසේ නොවන ආකාරයෙන් සහභාගීවීමට අවස්ථාව දිය යුතුය. මෙම නියෝජිතයින්ට කාලීනව හා නිසි අයුරින් එවන් රැස්වීම්වල වාර්තා හා පිටපත් ලබාදීමට පියවර ගත යුතුය.

7.1.7 සංරක්ෂණ හා කළමනාකරණ වැඩ පිළිවෙල නියත වශයෙන් පිළිපදිනවාද කියා සත්‍ය වශයෙන් දැනගැනීමට රාජ්‍යයන් තම ධාරිතාවන්ට අනුව හා බල ප්‍රදේශයන්හි ධීවර කටයුතු සෝදිසියට පරීක්ෂණයට, පාලනයට හා නීතිය ක්‍රියාවේ යෙදවීමට ප්‍රබල යාන්ත්‍රණයක් පිහිටුවාලීම කළ යුතුය.

7.1.8 සංරක්ෂණ හා කළමනාකරණ වැඩ පිළිවෙල සත්‍ය වශයෙන්ම ඉපුවේද යන පූර්ව කොන්දේසිය උදෙසා රාජ්‍යයන් ප්‍රමුඛත්වය දිය යුතුව ඇති අතර එමගින් සම්පත දිගින් දිගට පවත්වා ගනිමින් එහි වල නෙලා ගත හැකි අන්දමින් අධි ධාරිතාවයක් හෝ අධික ලෙස අස්වනු ලබා ගැනීම කරා පිය නැගීමට අවකාශ නොදී සංරක්ෂණ හා කාර්යක්ෂම කළමනාකරණ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සෝදිසියෙන් සිටීම සඳහාය.

7.1.9 රාජ්‍යයන් උපකලාපීය හා කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන අන්තර් ධීවර කළමනාකරණ යාන්ත්‍රණය තුළ සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ ඇති විනිවිද පෙනෙන බවට සහතිකයක් දිය යුතුය.

7.1.10 රාජ්‍යයන්, කලාපීය හා උපකලාපීය ධීවර කළමනාකරණ සංවිධාන හෝ වෙනත් අදාළ ආයතන කළමනාකරණ හා සංරක්ෂණ ක්‍රියාවලි පිළිබඳව අවශ්‍ය ප්‍රසිද්ධිය ලබා දිය යුතු අතර ධීවර කටයුතු පාලනය කරන නීති හා කොන්දේසි අකුරටම පිළි පදිනවාද යන්න සෝදිසියෙන් සිටිය යුතුය. මෙහි පදනම හා අවශ්‍යතාවය වනුයේ සම්පත් නෙලා ගන්නන් හට එකී සම්පත නෙලා ගැනීමේදී එහි ක්‍රියාකාරිත්වය විස්තර කරදී එයට ඔවුන්ගේ සහාය ද ලබා ගන්නා අයුරියෙන් විය යුතුය.

## 7.2 කළමනාකාරිත්වයේ අරමුණු

7.2.1 ධීවර සම්පත් ධාරණීය මට්ටමින් දිගුකාලීනව පවත්වාගෙන යා යුතු බව හඳුනා ගෙන සහ එය සංරක්ෂණයේ හා කළමනාකරණයේ ඇති වැදගත්කම අරමුණු කොට ගෙන රාජ්‍යයන්, උපකලාපීය හා කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන ක්‍රියාකල යුතුය. මෙහිදී විද්‍යාත්මක කරුණු මත පදනම්ව උපරිම ධාරණීය මට්ටම පවත්වා ගනිමින් අස්වනු නෙළීම ක්‍රමානුකූලව සිදු කිරීමට යෝග්‍ය පරිදි වැඩ සලසාදීමෙන් පාරිසරික හා ආර්ථික සාධක ගැන සැලකිලිමත්ව ක්‍රියා කිරීමටත් ඉදිරිපත් විය යුතුය. මෙහිදී සංවර්ධනය වන රටවල් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළයුතුය.

7.2.2 දිගුකාලීන කළමනාකරණ අරමුණු සත්‍ය වශයෙන් ඉටුවීමට රාජ්‍යයන් හා ධීවර කළමනාකරණ සංවිධාන අනුමත සැලැස්මක් ක්‍රියාවට නැංවීමේදී පහත සඳහන් කරුණු ගැන සිත් යොමු කළ යුතු වේ.

* අධික අස්වනු නෙලීමෙන් වැළකීම හා ධීවර සම්පතේ ආර්ථික පැවැත්ම සහතික කර පවත්වා ගත හැකි අන්දමට සුරැකෙන බව
* ධීවර කර්මාන්තය මෙහෙයුම් සිදුකිරීමේදී ආර්ථික කොන්දේසි අනුව වගකිව යුතු අන්දමට අස්වනු නෙලා ගැනීම වර්ධනයක් සිදු වෙන බව.
* පරිසර පද්ධතියේ හා ජලජ නිජ බිම්හි ව විවිධත්වය හා සංරක්ෂණ කටයුතු සිදු කෙරෙන බව සහ තර්ජනයට ලක්ව ඇති මත්ස්‍ය විශේෂ කෙරෙහි අවධානය යොමුකර ආරක්ෂා කිරීම,
* හීනවී යන සම්පතක් වෙතොත් එය ප්‍රකෘතිමත් කිරීමට ඉඩ සළසා, යෝග්‍ය අවස්ථාවන්හි එවන් සම්පත් ක්‍රියාකාරීව යථා තත්වයට ගෙන ආ යුතු බවට,
* මිනිසාගේ ක්‍රියාකාරීත්වය නිසා සම්පත් වලට අහිතකර පාරිසරික බලපෑම් ඇතිවේ නම් එය නිසි ආකාරයෙන් තක්සේරු කර නිවැරදි කරන ක්‍රියා මාර්ගයන් ගන්නා බවට,
* අස්වනු නාස්තිය හා අත්හැර දමන ලද පන්න අවම කරමින් හැකිතාක් දුරට ඉන් වැළකී සිටින බව (පරිසර දූෂණය , නාස්තිය, අස්වනු ඉවත නෙලීම, ඉලක්ක නොවන මත්ස්‍ය හා මත්ස්‍ය නොවන විශේෂ අසුවීම වැනි දේ මගහැරීමට ප්‍රයෝගික, වරණීය උපක්‍රම භාවිතය, හෝ පාරිසරිකව හානිකර නොවන , ධීවර ආම්පන්න හා තාක්ෂණය භාවිතා කිරීම. )

7.2.3 ජලජ පරිසරයට අහිතකර බලපෑම් ඇති කරවන වෙනත් ධීවර නොවන කටයුතු ගැන රාජ්‍යයන් සුපරීක්ෂාකාරී විය යුතුය. එමෙන්ම එවැනි පරිබාහිර කටයුතු ධීවර අරමුණු ඉටුකර ගැනීම උදෙසා බාධාවක් නොවන බවට රාජ්‍යයන් වග බලා ගත යුතුය.

## 7.3 කළමනාකාරිත්ව රාමුව හා ක්‍රියා පිළිවෙත්

7.3.1 සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමට නම් ධීවර කළමනාකරණය , බෙදා හැරෙන මුළු ප්‍රදේශ පුරා විහිදී ඇති සම්පත් ඒකකය ගැන සැළකිලිමත් වී නිෂ්ප්‍රයෝජන ද්‍රව්‍යයේ ඉවතලෑම් ගැනද සොයා බැලිය යුතුය. වෙරළාසන්න රාජ්‍යයන් හා එම රාජ්‍යයන්ගේ (EEZ) අනන්‍ය ආර්ථික කලාපයට ඔබ්බෙන් පිහිටි සාගරයෙහි ඇති මත්ස්‍ය සම්පත් හෝ මුළුමනින්ම මහා සාගරයේ ඇති මත්ස්‍ය සම්පත පිළිබඳ සංරක්ෂණ හා කළමනාකරණ වැඩ පිළිවෙළ සම්පත් විසිර ඇති තාක් දුරට ක්‍රියාත්මක කල යුතුවේ.

අනෙකුත් දේ අතර, රාජ්‍යයන්ගේ ධීවර කළමනාකරණ අධිකාරීන් සම්පතේ භූගෝලීය සීමා හා එය වැටී ඇති බලප්‍රදේශ කොතෙක්ද කියා හෝ එහි එන පරාට පවතින තෙක් සංක්‍රමණය වන ප්‍රදේශය නිර්ණය කිරීමට ලබා ගත හැකි හොඳම සාක්ෂි උපයෝගී කරගත යුතුය.

7.3.2 මත්ස්‍ය සම්පත් සංක්‍රමණය වෙන හෝ පවතින සෑම රාජ්‍යයක බල ප්‍රදේශයන්ගේ, නියෝජිතයන්ගෙනුත් සමන්විත උප කලාපීය හෝ කලාපීය ධීවර කළමනාකරණ අධිකාරයක් පිහිටුවිය යුතුය. එයට නියත වශයෙන්ම එකී සම්පත නෙලාගන්නා වෙනත් රාජ්‍යයන්ගේ නියෝජිතයන්ද එක් කල යුතුවේ.

7.3.3 ධීවර කළමනාකරණ සංවිධාන නම දිගු කාලීණ කළමනාකරණ අරමුණු කළමනාකරණ ක්‍රියාවන්ට පරිවර්තනය කර ගත යුතුය. එය සකස් කර ගත හැක්කේ ධීවර කළමනාකරණ සැලැස්මක් ලෙස හෝ වෙනත් කළමනාකරණ රාමුවක් ආකාරයටයි.

7.3.4 ධීවර කර්මාන්තයට අදාළ සෑම කරුණක් සඳහාම ජාත්‍යන්තර සහයෝගිතාවය හා සම්බන්ධීකරණ කටයුතු උදෙසා ධීවර කළමනාකරණ බලධාරීන් උනන්දු විය යුතුය. එයට ප්‍රවෘත්ති හුවමාරුව හා තොරතුරු එක් රැස්කිරීම, ධීවර පර්යේෂණ හා එගකිවයුතු ධීවර කටයුතු උදෙසා මනා කළමනාකරත්වය එක්කළ යුතුය.

7.3.5 ධීවර ක්ෂේත්‍රයට අයත් නොවන සංවිධානයක මාර්ගයෙන් යම් ක්‍රියාමාර්ගයක් ක්‍රියාවට නැංවීමට අදහස් කරන රාජ්‍යයන් කල් ඇතිව උපකලාපීය හෝ කලාපීය ධීවර කළමනාකරණ සංවිධානයන් හා සාකච්ඡා පවත්වා එහි අදහස් උදහස් සැලකිල්ලට ගත යුතුවේ. ඊට හේතුව ඔවුන් ඉලක්ක කොටගත් ක්‍රියා මාර්ග එවැනි සංවිධානයක සංරක්ෂණ හා කළමනාකරණ වැඩ පිළිවෙලට බාධා පැමිණිය හැකි නිසාය.

## 7.4 කළමනාකරණ උපදෙස් හා දත්ත රැස් කිරීම

7.4.1 සංරක්ෂණ හා කළමනාකරණ වැඩ පිළිවෙල හඳුන්වාදීම සලකා බැලීමේ අවස්ථාවන්හිදී සම්පත් පිළිබඳ විද්‍යාත්මක දත්තයන් ගැනද සැලකිලිමත් විය යුතුවා සේම එමගින් වත්මන් මත්ස්‍ය සම්පත්හි තත්වය ඇගයීමට ලක් කිරීමත්, යෝජිත තත්වයන් මගින් සම්පත් මත ඇති කරන බලපෑමද සැලකිල්ලට ගත යුතුය.

7.4.2 සම්පත් කෙරෙහි දේශගුණය, පරිසරය, සමාජ ආර්ථික සාධක බලපෑම වැනිදේ අධ්‍යනය පිළිබඳව හා ධීවර සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ පර්යේෂණ කටයුතු උනන්දු කරවිය යුතුය. මෙම පර්යේෂණයන්ගේ ප්‍රතිඵල ඒවා ලබාගැනීමට උනන්දු වන්නන්ට ලබාදීමට පියවර ගත යුතුය.

7.4.3 වියදම් හා ප්‍රතිලාභ ගැන අවබෝධය , ප්‍රතිලාභ, හා විකල්ප කළමනාකරණ ක්‍රමයන්හි බලපෑම ගැන රාජ්‍යයන් තර්කානුකූලව කරුණු දැක්විය යුතුය. මෙයින් ධීවර කටයුතු හේතු තාර්කිකව නිවැරදි ව සිදු කෙරෙන බව දැක්විය හැකි අතර, අධි අස්වනු නෙලාගැනීම හා අධි ප්‍රාග්ධන ආයෝජනයන් පිළිබඳ ගැටළුද විසඳාගත හැකි වනු ඇත.

7.4.4 සංඛ්‍යා ලේඛණ විශ්ලේෂණය උදෙසා හැකිතාක් විස්තරාත්මකව ධීවරයන් ගේ උත්සාහයන් හා ගොඩට ගත් මසුන් පිළිබඳව (Catch and fishing efforts ) ජාත්‍යන්තර සම්මතයන්ට අනුව පිළිගත හැකි සංඛ්‍ය ලේඛණ කල්වේලා ඇතිව පරිපූර්ණව එකතුකිරීම ගැන රාජ්‍යයන් සහතික විය යුතුය. එසේ කොට, යෝග්‍ය ක්‍රමයක් මගින් සැබෑ බව ඔප්පු කර රහස්‍යභාවයට යෝග්‍ය අවශ්‍යතාවන්ට අනුරූපව ප්‍රකාශ කල යුතු වේ.

පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා හුරුපුරුදු වලට අනුකූලව කරන ලද ධීවර කටයුතු මගින් අල්ලා ගන්නා ලද මසුන් ප්‍රමාණය පිළිබඳ නවතම ප්‍රවෘත්ති රාජ්‍යයන්ට ලබාදිය යුතු වේ.

7.4.5 දත්ත එකතුව හා පර්යේෂණ මගින් ධරණීය ධීවර කටයුතු කළමනාකාරත්වයේ පහසුව සදහාත්, සමාජ හා ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සදහාත් මේ තුළින් රාජ්‍යයන් හා ධීවර කළමනාකරණ සංවිධානයන්හි සමාජ, ආර්ථික හා ආයතනික සාධක සංවර්ධනය කිරීම පිළිබඳව තොරතුරු එකතුව , විග්‍රහය හා පර්යේෂණ වර්ධනය කළ යුතුය.

7.4.6 ධීවර කටයුතු වලට අදාළ හා නන් අයුරින් වැදගත්වන විද්‍යාත්මක දත්ත රාජ්‍යයන් මගින් සම්පාදනය කළ යුතුවේ. මෙය ජාත්‍යන්තරව එකඟවූ ක්‍රමවත් ආකාරයකට සකසා කල් වේලා ඇතිව අදාළ ධීවර කළමනාකරණ අධිකාරියට ලැබීමට සැලැස්විය යුතුවේ. මෙම දත්ත හා සබැඳිය යුත්තේ සාගර සීමාවන් හරහා යන හා ගැඹුරු මුහුදේ ධීවර සම්පත් ද සංක්‍රමණික මත්ස්‍ය සම්පත් ද පිළිබඳවයි.

7.4.7 උපකලාපීය හෝ කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන ධීවර සම්පත් ගැන උනන්දුවක් දක්වන රාජ්‍යයන්ට හා වෙනත් පාර්ශවයන්ට ජාත්‍යන්තර එකඟත්වයකට පැමිණි පරිදි කලට වේලාවට ඔවුනට එම දත්ත සපයා දීම කළ යුතු කාර්යයක් වන අතර ඒවායේ රහස්‍යභාවය සුරැකීම එකඟතාවයන් පරිදි සිදු වනු ඇත.

## 7.5 පූර්වෝපායික ප්‍රවේශය

7.5.1 මුහුදු පරිසරය සුරැකීමටත් ජලජීවී සම්පත් සංරක්ෂණයටත්, කළමනාකරණයට හා සජීවී මත්ස්‍ය සම්පත් නෙලා ගැනීමේදී පූර්වෝපායික ප්‍රවේශය බහුලව යොදා ගත යුතුය. සංරක්ෂණය හා කලමනාකරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රමාණවත් විද්‍යාත්මක දත්ත නොමැතිවීම එය කල්දැමීමට හෝ අතපසු කිරීමට හේතුවක් කරගත යුතු නැත.

7.5.2 පූර්වෝපායික ප්‍රවේශය යොදාගැන්මේදී ධීවර කළමනාකරණ අධිකාරීන් සැලකිලිමත් විය යුතු කරුණු අතර මත්ස්‍ය ප්‍රමාණය මැනගැන්මේ හා නිෂ්පාදනයේ අස්ථිර භාවය, මත්ස්‍ය සම්පතේ සාරවත්භාවය හා මත්ස්‍ය ගහනයේ පවතින තත්වය , කළමනාකාරත්වය සඳහන් කොට ඇති කාරනා, මරණ සංඛ්‍යාවේ මට්ටම් හා බෙදීයාම, මුල මසුන් හා ඔවුන් මත යැපෙන වර්ගයේ වෙනත් ජීවීන් මෙන්ම, දේශගුණික, පාරිසරික, සමාජමය හා ආර්ථික තත්වයන් මේ යටතට ගැනේ.

7.5.3 පූර්වෝපායික ප්‍රවේශයට පදනම් විය යුත්තේ ලබාගත හැකි ඉහළම විද්‍යාත්මක සාක්ෂීන්ය.

අ) මෙයට සියලුම යෝග්‍ය ශිල්පක්‍රම අඩංගුවිය යුතු අතර ඉලක්කය විය යුත්තේ සංරක්ෂණ හා කළමනාකාරත්වයේ දැනගැනීමට පැළැන්තියට විශේෂිත වූ අවම ප්‍රමිතීන් නියම කිරීමයි.

ආ) ගහණයකට අදාළ සීමාවන් නිර්ණය සහ මෙම සීමාවන් ඉක්මවා ඇතිවිට ක්‍රියාමාර්ග ගත යුතුය. නියමිත සීමාවන්ට ළඟාවූ විට එය ඉක්මවා

නොයාමට පියවර ගැනීමට සහතික කළ යුතුය.

7.5.4 සංරක්ෂණය හා කළමනාකරණ කටයුතු පිළිබඳව අවධානය යොමු කරමින් නව ධීවර උපාය මාර්ග යෙදවීමේදී හෝ ගවේෂණාත්මක ධීවර කර්මාන්තයේදී මසුන් ඇල්ලීමේ හා ප්‍රයත්නයන්හී සීමාවන් (Catch limits and Effort limits) යෙදීමට රාජ්‍යයන් පියවර ගත යුතුය. මෙම පියවරයන් දිගුකාලීන ධරණීය ධීවර සම්පත්හි පැවැත්ම සහතික කරන දත්ත ලබාගන්නා අයුරින් විය යුතුය. මෙම තත්වයන් මගින් ක්‍රමවත් ධීවර සම්පත් වර්ධනයට ඉඩ සලසා දිය යුතුය.

7.5.5 ස්වාභාවික සංසිද්ධීන් ධීවර සම්පත් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරයි නම් සංරක්ෂණ හා කළමනාකරණ උපක්‍රම මගින් සම්පත විනාශ නොවීමට වගබලා ගත යුතුය. තත්වය පරීක්ෂාවට ලක්වූ ධීවර සම්පත් වේ නම් මසුන් ඇල්ලීමේ මුහුදු සීමාවන් නියම කළ යුතු අතර, එය හැකි විගස ධීවර කටයුතුවල යෙදෙන අය හා එක්ව ක්‍රියාත්මක කොට මත්ස්‍ය බෝවීමේ ප්‍රමාණවත් දත්ත ලැබෙන තුරු එය කෙසේ දිගුකාලීන අන්දමට සම්පතට බලපාන්නේද කියාත් නිගමනය කරන තුරු පවත්වා ගත යුතුය.

## 7.6 කළමනාකාරිත්ව උපක්‍රමයන්

7.6.1 ධීවර සම්පත් නෙළීමට රාජ්‍යයන් අවසර දීමේදී ධීවර සම්පත්හි තත්වය (ප්‍රමාණය) පිළිබඳව සැලකිල්ලට ගනිමින් එය ඉටු කිරීම සහතික විය යුතුය.

7.6.2 වගකිවයුතු ධීවර කටයුතු උදෙසා පූර්ව කොන්දේසියක් වශයෙන් මත්ස්‍ය සම්පත් දැරිය හැකි ප්‍රමාණයන් අනුව අස්වනු නෙළීම කරන අතර පහත සදහන් කළමනාකාරිත්ව නියමයන් අනුගමනය කල යුතුව ඇත.

* බලය ලත් යාත්‍රාවකට හැර වෙනත් යාත්‍රාවන්ට ධීවර කටයුතු වල යෙදීමට ඉඩ නොදිය යුතුය. එය ජාත්‍යන්තර නීතියට එකගව ගැඹුරු මුහුදේ මසුන් නෙළීමට ඇති ඉඩකඩ මෙන්ම ජාතික දේශසීමා ආශ්‍රිතව පනවා ඇති ජාතික

නීතිමය තත්වයනට යටත්ව සිදුවිය යුතුය.

* බලයලත් ධීවර යාත්‍රා පිළිබඳව සටහන් තබාගෙන ඊට අදාල සියලු විස්තර එනම් යාත්‍රාවේ වර්ගය ප්‍රමාණය යනාදේ එහි සඳහන් කිරීම.

* සටහනේ සඳහන් දත්ත අනුව යාත්‍රාවන්ගේ ධාරිතාවයන් අධීක්ෂණය කරමින් මෙහෙයුම් වැය, ප්‍රාග්ධන ආයෝජනය, සහ අස්වනු ප්‍රමාණය මැන සළකුණු කර ගැනීම.

* ධීවරයින් තම මෙහෙයුම් කටයුතු වල යෙදෙන්නේ වගකිව යුතු අන්දමට ද කියා සොයා බැලීමට යාත්‍රා සඳහා ආයෝජනය කරන ලද ප්‍රාග්ධණය හා ආධාරක යටිතල පහසුකම් හා යාත්‍රා මෙහෙයුම් සඳහා ආධාරක යටිතල පහසුකම්, අස්වැන්නේ වටිනාකමට ප්‍රමාණවත් ද කියා පරීක්ෂාකාරීව සිටීම.

7.6.3 අධිධාරිතාවයන් පවතින්නේ නම් ඒවා පිළිගත හැකි ධරණීය උපයෝගී මට්ටම් දක්වා ධාරිතාව අඩුකරගැනීමට රාජ්‍යයන් යන්ත්‍රණ ස්ථාපනය කළ යුතුය. එමඟින් වගකිව යුතු ධීවර කර්මාන්තයක් වර්ධනයට පියවර ගත යුතුය. ඉහත යන්ත්‍රණය තුල ධීවර යාත්‍රාවන්හි ධාරිතාවයද අධීක්ෂණය කළ හැකි විය යුතුය.

7.6.4 මෙහෙයුම් සඳහා යොදා ගන්නා සියලු ධීවර උපකරණ හා භුරුපුරුදු රාජ්‍යයන් සතු කාර්යයක් වශයෙන් ප්‍රවේශම්කාරීව විභාගයට ලක් කල යුතුවේ. ඉන් පසු වගකිව යුතු තත්වයේ නොපවතින ඒවා ඉවත් කර පිළිගත හැකි විකල්ප මගින් ඒවා හිලව්වු කළ යුතුව ඇත. මේ අවස්ථාවේදී රාජ්‍යයන් එකී ක්‍රියාමාර්ග ධීවර ප්‍රජාවන්ට කෙසේ බලපාන්නේද කියා හා ඔවුනට සම්පවීමට ඇති අවකාශ ඉන්මග හැරේවිද යන්න ගැන විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය.

7.6.5 විවිධ යාත්‍රා, උපකරණ හා මසුන් මැරීමේ විවිධ ක්‍රම අනුගමය කරන ධීවරයන් අතර මසුන් මැරීම සඳහා සට්ටන හට ගැනීම වැළැක්මේ නීතිරීති සම්පාදනයට රාජ්‍යයන් හා ධීවර කළමණාකාරිත්ව සංවිධාන සඳහා බලය පැවරිය යුතු වේ.

7.6.6 ධීවර සම්පත් භාවිතය, සංරක්ෂණය හා කළමනාකාරිත්වය තීරණ කිරීමේදී දේශයේ ජනතාවගේ පාරම්පරික අයිතිවාසිකම් හා තම එදිනෙදා දිවි පෙවෙත මත්ස්‍ය සම්පතෙන් යැපෙන දේශීය ධීවර ප්‍රජාවන්ට ප්‍රමුඛත්වය දිය යුතුය.

7.6.7 විකල්ප සංරක්ෂණ හා කළමනාකරණ නියමයන් ඇගයීමේදී ඒවායේ සමාජීය බලපෑමත් සඵලභාවය ගැනත් සැළැකිලිමත් විය යුතුය.

7.6.8 සියලු සංරක්ෂණ හා කළමනාකරණ නියමයන්හි යෝග්‍යතාවත් , ඇතිවිය හැකි අන්තර් සබඳතාත්, නිතර විවරණය කළ යුතුය. නව තොරතුරු මත පදනම්ව රාජ්‍යයන් හා ධීවර කළමනාකරණ සංවිධාන ඉහත නියමයන් යෝග්‍ය පරිදි පුනරීක්ෂණය කළ යුතුය. නොඑසේ නම් මුළුමනින්ම ඉවත දැමිය යුතුය.

7.6.9 කීටයන් ආරක්ෂාවටත්, ඉල්ලුමක් නැති හෝ ඉවතලන මසුන් හෝ මත්ස්‍ය නොවන විශේෂ ඇල්ලීමේ නාස්තිය වැළකීමට ධීවර කළමනාකරණ අධිකාරීන් තාක්ෂණික නියමයන් යෙදිය යුතුවේ. ඒවා නම් අල්ලා ගන්නා මාළුන්ගේ ප්‍රමාණයන්, උපකරන හෝ දැල් රෙගුලාසි, තහනම් පෙදෙස්, මුහුදු සංරක්ෂිත පෙදෙස් හඳුන්වා දීම හා අවශ්‍ය විටදී විවෘත හා සංවෘත කාලයක් ප්‍රකාශ කිරීම , මසුන් ඉවත ලෑම අල්ප කිරීමට වරණීය හා පාරිසරික තර්ජන රහිත විවිධ වර්ගයේ මසුන් ඇල්ලීමේ තාක්ෂණය හා කාර්යක්ෂම උපකරණ භාවිතා කිරීමේ රෙගුලාසි නිර්මාණය කළ යුතුය.

7.10 සිඳී යන සම්පත් නැවත වර්ධනය කිරීමට හා වඳවීමේ තර්ජනයට මුහුණ පා ඇති මත්ස්‍ය වර්ග ඉන් මුදා ගැනීමට රාජ්‍යයන් හා ධීවර කළමනාකරණ සංවිධාන නියමයන් හඳුන්වා දිය යුතුය. ධීවර කටයුතු හෝ වෙනත් මානව ක්‍රියාවලියක් හේතු කොටගෙන වඳවී යන තර්ජනයට මුහුණ පා ඇති සම්පත් නැවත ප්‍රකෘතිමත් කිරීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතුය. ප්‍රතිසංස්කරණය යටතේ රටේ පවතින නීති හා යෝග්‍ය ජාත්‍යන්තර ගිවිසුම් උපයෝගි කරගෙන ක්‍රියාත්මක විය යුත්තේ අදාළ සම්පත් වලට හා පරිසරයට ධීවර කර්මාන්තයෙන් හෝ මානව ක්‍රියාවලින් සිදුවී ඇති හානිය මගහරවා ගැනීමට හා ඒවා ප්‍රකෘති තත්වයට පත් කිරීම සහතික කිරීමටයි.

## 7.7 ක්‍රියාත්මක කිරීම

7.7.1 ධීවර සංරක්ෂණය හා කළමනාකාරීත්වය උදෙසා රාජ්‍යයන් ප්‍රාදේශීය හා ජාතික මට්ටමේදී යෝග්‍ය හා ප්‍රබල නීතිමය හා පරිපාලන රාමුවක් හඳුන්වාදී එය ක්‍රියාවට නැංවිය යුතුය.

7.7.2 ධීවර කටයුතු අධීක්ෂණය, ධීවර කළමනාකරණ බලධාරීන් විසින් උනන්දු කරවිය යුතුවේ. කලාපීය වශයෙන් එකඟත්වයකට පැමිණි ක්‍රියාපටිපාටියට අනුකූලව මෙම නියමයන් පවත්වා ගත යුතුය. කලාප හෝ උප කලාපයන්හිද එය එසේමය, තම තමන්ට වලංගු වන ධීවර නීති හා රෙගුලාසි ක්‍රියාවට නැංවීමේදී එය උදෙසා පිළියෙල කර ඇති විශේෂිත ගිවිසුම් සැළැකිල්ලට ගත යුතු වේ.

7.7.3 රාජ්‍යයන් තම නීති උපයෝගී කරගනිමින් කාර්යක්ෂම ධීවර අධීක්ෂණයක් හා පාලනයක් පවත්වා ගත යුතුය. යෝග්‍ය නිරීක්ෂණ වැඩ සටහන්, යාත්‍රා පරීක්ෂණ හා අධීක්ෂණ ක්‍රමයක් ඇතිකල යුතුය. එසේම ඒවා කලාපීය හා උපකලාපීය ධීවර සංවිධාන වල එකඟතාවයට අනුව සිදුකල යුතුය.

7.7.4 කලාපීය හා උපකලාපීය හෝ රාජ්‍ය ධීවර කළමනාකරණ සංවිධාන කටයුතු සඳහා කෙසේ කුමන ක්‍රියාකාරත්වයන්ට මුදල් යෙදවිය යුතුද කියා රාජ්‍යයන් එකඟත්වයකටආ යුතුය. මෙහිදී කල්පනාකාරී විය යුත්තේ ධීවර කටයුත්තෙන් උපදවන ප්‍රතිලාබ හා එක් එක් රටක් මුදලින් හෝ වෙනත් අන්දමින් දායකවීමත්, ඒ ඒ රටට ආවේනික ධාරිතාවන් අනුව එසේ ගෙවීම් කල යුතු බවයි. හැකි හා යෝග්‍ය සෑම විටදී කළමනාකරණය, අධ්‍යයන හා සංරක්ෂණ කටයුතු සඳහා මුදල් සපයා ගැනීමට ඉහත සංවිධාන ඉලක්ක කර ගත යුතුය.

7.7.5 ධීවර කළමනාකරණය හා එහි බලපෑම නිතිපතා විශ්ලේෂණය කළ හැකි විනිවිද පෙනෙන ක්‍රියාත්මක යන්ත්‍රණයක් පිහිටුවීම අවශ්‍යය. සංරක්ෂිත හා කළමනාකාරත්ව අරමුණු මේ යටතේ සෝදිසියට ලක් වේ. මෙම ක්‍රියාකාරිත්වය ධීවර කලමණාකරණ සංවිධානවල එකඟතාවයන්ට හා ජාත්‍යන්තර නීතියට යටත්ව සිදුවිය යුතුය.මෙහිදී ඉහත සංවිධානයේ සාමාජික නොවන ධීවර යාත්‍රා කලමනාකරණය හා සංරක්ෂණය කාර්යක්ෂමව ඉටුකිරිමට පියවර ගත යුතුය.

## 7.8 මූල්‍යමය ආයතනයන්

7.8.1 ජාත්‍යන්තර එකඟතාවයන්ට බාධාවක් නොවන පරිදි, ණය ලබාගැනීමේදි හෝ උගසට තැබීමේදි බැංකු හා වෙනත් මූල්‍ය ආයතන ඕනෑම රාජ්‍යය බල ප්‍රදේශයක් තුල ඒ ඒ ධජයන් එසවිය යුතුය යන අවශ්‍යතාවය ඉවත දැමිය යුතුය. කුමන අන්දමින් ණය ලබා ගත්තද තමන් ඔසවා තැබිය යුත්තේ තම ප්‍රතිලාභ වශයෙන් අස්වනු ලබා ගන්නා රාජ්‍ය ධජය පමණි.

## 8 වෙනි වගන්තිය - ධීවර මෙහෙයුම් කටයුතු

### 8.1 සියළුම රාජ්‍යයන්හි වගකීම්

8.1.1 තමන්ගේ මුහුදු සීමාවන් තුළදී තමන් විසින් අනුමත කරන ලද ධීවර මෙහෙයුම් කටයුතු පමණක් සිදුකරන්නේය යන්න සියළුම රාජ්‍යයක්ම දැන සිටිය යුතුවා සේම එවැනි කටයුතු වගකීමක් සහිතව සිදු කරන බවට සහතික විය යුතුය.

8.1.2 ධීවර කටයුතු සඳහා සියළු බලය පැවරීම් වලදී රාජ්‍යයන් වාර්තා පවත්වාගත යුතු අතර නිශ්චිත කාල සීමාවන් වලදී යලි එම වාර්තා අළුත් කළ යුතුය.

8.1.3 සියළුම ධීවර මෙහෙයුම් සඳහා අවසර දීමේදී , ජාත්‍යන්තර සම්මත තත්වයන්ට, එකඟව, සංඛ්‍යාත්මක දත්ත පවත්වා ගැනීමට රාජ්‍යයන් වගබලා ගත යුතුය.

8.1.4 තම තමන් නියම කර ඇති රාමුව තුළ සෑම රාජ්‍යයක්ම ධීවර හා අදාළ මෙහෙයුම් සඳහා අධීක්ෂණයට, සුපරීක්ෂාවට, පාලනයට හා ක්‍රියාවට නැංවීමට ව්‍යවහාර නීති මාලාවක් (ජාත්‍යන්තර නීතියට අනුකූලව ) පිහිටුවිය යුතුවේ.

8.1.5 රාජ්‍යයන් විසින් ධීවර මෙහෙයුම් සඳහා සේවයෙහි යොදාගන්නා අයගේ සෞඛ්‍ය තත්ත්වය හා ආරක්ෂක තත්වයන් සඳහා ප්‍රමිති සහ නියමයන් පැනවීම අවශ්‍යය. මෙහිදී විශේෂ සැලකිල්ලක් දැක්විය යුත්තේ සේවා කොන්දේසි අදාළ ජාත්‍යන්තර ගිවිසුම්හි සඳහන් විධි විධාන වල අවම අවශ්‍යතාවන් ඉක්මවා පිලිපැදීමටය.

8.1.6 මුහුදේදී අනතුරට පත්වූවන් බේරා ගැනීමේ කාර්යයද, ධීවර මෙහෙයුම් හා ඒකාබද්ධ විය යුතුය. මෙහිදී රාජ්‍යයන් තම තමන් විසින් තනිව හෝ වෙනත් රාජ්‍යයන් හෝ යෝග්‍ය ජාත්‍යන්තර සංවිධාන සමඟින් ඒකාබද්ධ වී සහයෝගිතා වැඩ පිළිවෙලක් සැකසිය යුතුවේ.

8.1.7 අධ්‍යාපනික හා පුහුණු වැඩ සටහන් මඟින් ධීවරයින්ගේ දක්ෂතාවය ඉහල නැංවීමට කටයුතු යොදනවා සේම, යෝග්‍ය විටදී ධීවර වෘත්තිමය සුදුසුකම් ඉහල නැංවීමටද ක්‍රියාකල යුතුය. මෙම වැඩ සටහන් ජාත්‍යන්තර වශයෙන් පිළිගෙන ඇති සම්මත ක්‍රම හා උපදෙස් අනුව පිළියෙල කල යුතුය.

8.1.8 තම ජාතික නීති රීති වලට අනුකූලව හැකි සැම අවස්ථාවන්හිදී ධීවරයින්ගේ කුසලතාවයන් හා සේවාවන් ගැන සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් සටහන් සැම රාජ්‍යයක්ම තබා ගත යුතුය. මෙහිදී අඩංගු විය යුතු තොරතුරු අතර සේවාවන් පිළිබඳ කුසලතා සහතිකය, සුදුසුකම් හා සේවයද ඇතුලත් වේ.

8.1:9 යෝග්‍යතා සහතිකයක් දරන්නෙකු ධීවර මෙහෙයුමකදී යම් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරත්ද ඔහුගේ සහතිකය ගැන පරීක්ෂණ ඇරඹීමක් වෙතොත්, ඔහු පිළිබඳ සියලු විස්තර සහතිකය නිකුත් කළ රාජ්‍යයට එකී චෝදනා එල්ල කරන අය දැනුම් දිය යුතුය. එවැනි විටක දඬුවම් දීමට විධිවිධාන එකී රාජ්‍යයේ නීති තුළ අඩංගු විය යුතුය. එවිට අදාල රජය පරීක්ෂණයක් පවත්වා එම වරද තම ජාතික නීතියට අනුව දඬුවම් ලැබිය යුතු වරදක් වේ නම් සුදුසු ක්‍රියා මාර්ගයක් ගෙන (සහතිකය අවලංගු කිරීම, ප්‍රතික්ෂේප කිරීම, හෝ තාවකාලික අත්හිටුවීමද ඇතුළුව ) ඒ පිළිබඳ විස්තර එම පුද්ගලයාගේ වාර්තා පොතට ඇතුළත් කළ යුතුය.

8.1.10 වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් පිළිබඳ අත්‍යාවශ්‍ය වන දැනුම හා ඒවාට අදාල ජාත්‍යන්තර සම්මුති පිළිබඳ මූලික දැනුමක් අධ්‍යාපනය හා පුහුණුව තුළින් සෑම ධීවරයෙකුම සතුව ඇත්ද යන්න සහතික වීමට රාජ්‍යයන් උත්සාහ ගත යුතුය. මෙයට යෝග්‍ය පාරිසරික හා වෙනත් ප්‍රමිති සහ ආචාර ධර්ම පද්ධතියේ විධිවිධානද ඇතුළත්ය.

## 8.2 ධජ රාජ්‍යයන්ගේ වගකීම

8.2.1 තම ධජය නැංවීමට අවසර දී ඇති සෑම ධීවර යාත්‍රාවක් ගැනම ඒ ඒ රාජ්‍යයන් සටහනක් තබාගත යුතුය. එකී සටහනේ යාත්‍රා පිළිබඳ විස්තර, අයිතිකරුවන් කවුරුන්ද හා ධීවර මෙහෙයුම් සඳහා බලය පවරා ඇති සීමා ද පැහැදිලිව දැක්වීම අවශ්‍ය වේ.

8.2.2 සෑම රාජ්‍යයක්ම තම ධජය නැංවා ඇති ධීවර යාත්‍රා ගැඹුරු සාගරයේ හෝ වෙනත් රාජ්‍යයක බල ප්‍රදේශ මුහුදු සීමාවන් තුළ ධීවර මෙහෙයුම් වල නොයෙදෙන බවට සහතික කළ යුතුය. එසේ කළ හැක්කේ බලයලත් නිලධාරියෙකුගේ ලියාපදිංචි සහතිකයක් ඒ සඳහා නිකුත්කර ඇතොත් පමණි. එවැනි අවස්ථාවන්හිදී මේ සියලු ලිපි ලේඛණ අදාල යාත්‍රාවේ තිබිය යුතුය.

8.2.3 ගැඹුරු සාගරයේ හෝ වෙනත් රාජ්‍යයක බල ප්‍රදේශයට අයත් මුහුදු සීමාවන් තුළ ධීවර මෙහෙයුම් සඳහා අවසර ලත් සෑම ධීවර යාත්‍රාවක්ම ජාත්‍යන්තර නීතියටත්, ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ( FAO ) සම්මත ප්‍රමිති නියමයන්ටත් අනුව ජාත්‍යන්තරව හඳුනා ගත හැකි හා ඒකීය යාත්‍රා සලකුණු ක්‍රමයකට අනුව සලකුණු තබා තිබිය යුතුය.

8.2.4 ජාත්‍යන්තර හෝ කලාපීය මට්ටමින් එකඟතාවයකට පැමිණි ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ ද සැලකිල්ලට ගෙන තම ජාතික නීතිය ප්‍රකාර සෑම ධීවර උපකරණයක්ම සලකුණු කොට තැබිය යුතුය. ධීවර ආම්පන්නයේ අයිතිකරු හඳුනාගත හැකි පරිදි ජාතික නීතියට අනුකූලව මේවා සලකුණු කල යුතුය.

8.2.5 ධීවර යාත්‍රාවන් යෝග්‍ය ආරක්ෂිත විධිවිධාන හා අවශ්‍යතා පිළිපදිනවාද යන්න සහතික වීම, ධජ රාජ්‍යයන් සතු වගකීමකි. මෙම අවශ්‍යතා ජාත්‍යන්තර සම්මුති , ජාත්‍යන්තර වශයෙන් එකඟත්වයට පැමිණි පද්ධති හා ස්වේච්ඡා මාර්ගෝපදේශයන් අනුව සැකසිය යුතුය. කුඩා ධීවර යාත්‍රා සඳහා ද මේ අන්දමටම රාජ්‍යයන් මගින් යෝග්‍ය ආරක්ෂිත විධිවිධාන හා අවශ්‍යතා පනවා පිළිපැදිය යුතුය. මෙයට හේතුව කුඩා ධීවර යාත්‍රා සඳහා ඉහත සම්මුතීන් මගින් ආවරණයක් නොලැබෙන බැවිනි.

8.2.6 මහා සාගරයේ ධීවර යාත්‍රා අයත් ජාත්‍යන්තර සංරක්ෂන හා කළමනාකරණ නියමයන්ට අනුකූලතාවය වර්ධනය කිරමේ ගිවිසුමට අදාළ නොවන පාර්ශවයන් එම ගිවිසුම් ප්‍රකාරව නීති හා රෙගුලාසි උපයෝගී කර ගැනීමට දිරිගැන්විය යුතුය.

8.2.7 යෝග්‍ය සංරක්ෂණ හා කළමනාකරණ නියමයන් උල්ලංඝණය කරන ධීවර යාත්‍රා අයත් රාජ්‍යයන් ( හෝ තම ධජය නැංවා ඇති යාත්‍රා එසේ කරතොත්) එම නියමයන් වලංගු කර නීති රීති තම ජාතික නීති මාලාවන්ට අතුළත් කර කටයුතු කිරීමටද මැලි නොවිය යුතුය. මෙම නීති විරෝධී කටයුතුවල යෙදෙන්නන් ඉන් මුදා ගැනීමට එකී ප්‍රතිලාභ නොලැබී යන සේ දඬුවම් පැමිණවිය යුතුය. අවශ්‍ය වෙතොත් තදින් ක්‍රියාකිරීමෙන් ධීවර මෙහෙයුම් සඳහා යාත්‍රා යෙදවීම අත් හිටුවීම හෝ තහනම් කිරීමද යෝග්‍ය වේ.

8.2.8 ධීවර යාත්‍රා අයිතිකරුවන් හා යාත්‍රා කුලියට ගන්නන් හට රක්ෂණ ආවරණය ලබා දීමට ධජ රාජ්‍යයන් උනන්දු විය යුතුය. එමෙන්ම යාත්‍රාවේ සේවකයන්ගේ ආරක්ෂාවට හා අදාළ ගෙවීමේ වගකීමෙන් නිදහස් කිරීමටත්, ඔවුන්ගේ ඕනෑ එපාකම් ආවරණය වන පරිදි රක්ෂණය කිරීමටත් අලාබය හෝ වන්දිය ගෙවීමෙන් තුන්වෙනි පාර්ශවය නිදහස් කර ගැනීමටත් යාත්‍රා අයිතිය හෝ කුලියට ගන්නා අය වෙත පැවරෙන වගකීමකි.

8.2.9 1987 (නො. 166) පුනරක්ෂිත මුහුදු රැකියාව කරන්නන් නැවත සියරට පැමිණවීමේ ගිවිසුමේ මුලධර්මයන්ට අනුව ධජ රාජ්‍යයන් ධීවර යාත්‍රාවල සේවය කරන්නන්ට ක්‍රියා කිරීම සහතික කල යුතුය.

8.2.10 ධීවර යාත්‍රාවන්ට වන හදිසි අනතුරු සහිත අවස්ථාවන් සැලකිල්ලට ගනිමින් ධීවර යාත්‍රාවක සේවක පිරිස පිළිබඳව ගිවිසුමක් සැකසීමේදී එකී සේවක පිරිසගෙන් එක් අයෙකු හෝ සියලු දෙනා හෝ තමන් අත වරදක් නොමැතිව අතරමං වුවහොත් එකී ගිවිසුමෙහි ඔවුන් නැවත සියරටට යාම සඳහා යොමු කළ යුතු වරාය පැහැදිලිව සටහන් කල යුතුය. මෙම තොරතුරු ජාත්‍යන්තර සමුද්‍රික සංවිධාන වලටද ප්‍රායෝගිකව හා යෝග්‍ය විටදී සන්නිවේදනය කළ යුතුය.

## 8.3 වරාය රාජ්‍යයේ වගකීම

8.3.1 අදාල ජාත්‍යන්තර එකඟතා, ගිවිසුම් ප්‍රකාරව සැකසුණු හා ජාත්‍යන්තර නීති රීතිවලට අදාලව සැකසුනු ජාතික නීතිය යටතේ වරාය රාජ්‍යයන් වෙනත් රාජ්‍යයන්ට අවශ්‍ය සහයෝගය දිය යුතුය.

8.3.2 ධීවර යාත්‍රාවක් සිය කැමැත්තෙන්ම වෙනත් රාජ්‍යයක වරායකට පැමිණි විට හෝ වරායට පිටින් මුහුදේ නැංගුරම්ලා ඇතිවිට එම වරාය පිහිටි රජය එකී යාත්‍රාව තුළ මනා සෞඛ්‍ය ආරක්ෂාව හා අදාල කාර්යයන්හි යෙදීමේ යෝග්‍ය අවම ප්‍රමිතීන් හා අනුකූලව පවත්වා ගැනීමට සහාය දැක්විය යුතුය. එසේ නොමැති බව දැන ගත හොත් , එම රාජ්‍යය යාත්‍රාවේ ධජය අයත් රාජ්‍යටද, අදාල ජාත්‍යන්තර සංවිධානයන්ටද ඒ ගැන උපදෙස් දිය යුතුවේ. මේ සඳහා උදවු උපකාර බාහිර රාජ්‍යය ඉල්ලා සිටියොත් එකී අවම ප්‍රමිතීන්ට අනුකූලව සහය වීමට ජාතික හා ජාත්‍යන්තර නීති ප්‍රකාරව ක්‍රියා කළයුතුයි.

## 8.4 ධීවර මෙහෙයුම්

8.4.1 ධීවර කටයුතු වල යෙදෙන ධීවරයින්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීමේදී ජාත්‍යන්තර මුහුදු අනතුරු වැලැක්වීමේ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ මුහුදු ගමන් සංවිධානය සඳහා ඇති විධිවිධාන මෙන්ම, ජලජීවී පරිසරයේ ආරක්ෂාවද ධීවර උපකරණ හානිවීම හා නැතිවීම වැලැක්වීම වැනි අවස්ථාවන් සහතික කිරීම උදෙසා ද රාජ්‍යයන් සහතික විය යුතුය.

8.4.2 විසවිෂ හා ඩයිනමයිට් වැනි පුපුරණ ද්‍රව්‍ය උපයෝගී කර මසුන් ඇල්ලීම හා වෙනත් විනාශකාරී ධීවර උපක්‍රම භාවිතය රාජ්‍යයන් තහනමට ලක් කළ යුතුය.

8.4.3 ධීවර මෙහෙයුම් පිළිබඳ ලියවිලි වගකීමකින් පවත්වා ගෙන යැම සහතික කිරීමට රාජ්‍යයන් උත්සාහ ගත යුතුය. මෙයට අදාල වන්නේ ධීවර මෙහෙයුම් මගින් ඉවත ලන මසුන් හා රඳවා ගන්නා මත්ස්‍ය හා මත්ස්‍ය නොවන විශේෂ වැනිදේ සහ මත්ස්‍ය ගහනය ගණනයට අදාල තොරතුරුය. අදාල කළමනාකරණ ආයතනවලට රැස්කල තොරතුරු විධිමත්ව ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා නිරීක්ෂණ හා පරීක්ෂණ ක්‍රම මගින් යෝග්‍ය තත්වයන් වර්ධනය කර පවත්වා ගත යුතුය.

8.4.4 අලෙවි කර ගැනීමට බැරිව ඉතිරිවූ මසුන් සඳහා රාජ්‍යයන් යෝග්‍ය තාක්ෂණය හඳුන්වාදිය යුතුවේ. මෙහිදී ඉතිරිව ඇති මසුන් ඉතාමත්ම යෝග්‍ය ක්‍රමයට ආරක්ෂාව හා උපයෝගී කර ගැනීමට අවධානය යොමුකළ යුතුය.

8.4.5 ඉවත ලන මසුන් ප්‍රමාණය අඩුකිරීමට තාක්ෂණ උපක්‍රම සංවර්ධනය කර (ගොඩනගා) දියත් කිරීම හෝ වෙනත් අන්දමට සැකසීමේ ක්‍රම අදාල කණ්ඩායම්, කාර්මිකයන් හා එක්ව රාජ්‍යයන් මගින් සොයා බැලිය යුතුවේ. මසුන් ඇල්ලීමේ උපකරණ හේතු කොට ගෙන මසුන් අනුභවයට නුසුදුසු තත්වයට පත් වන්නේ නම් එවැනි ක්‍රම භාවිතය අඩුකිරීමට පියවර ගත යුතුය. එසේම මසුන්ගේ පැවැත්මේ හා ජීවත්වීමේ කාලසීමාව වැඩි කිරීමට හැකි උපකරණ නිපදවා එවැන්නක් භාවිතයට ධීවරයින් හුරු පුරුදු කළ යුතුය.

8.4.6 තාක්ෂණය යොදා ගැනීම හා සංවර්ධනය කිරීමට භාවිතා කරන ද්‍රව්‍ය හා මසුන් මැරීමේ ක්‍රම උපයෝගිතාව උදෙසා රාජ්‍යයන් සහාය දැක්විය යුතු අතර ධීවර උපකරන අහිමිවීම අවම කිරීමට සහ හානිකර පන්න අතහැර දැමීමට ක්‍රම සොයා ගැනීමටත්, එකී රාජ්‍යයන් හවුල් විය යුතුය.

8.4.7 යම් ප්‍රදේශයකට නව වාණිජ මට්ටමේ තාක්ෂණ උපක්‍රම භාවිතා කිරීම හඳුන්වාදීමට පෙර එම තාක්ෂණය තුළින් ධීවර පරිසරයට සිදුවිය හැකි බාධාවන් හා විනාශය පිළිබඳ පූර්ව තක්සේරුවක් කිරීමට රාජ්‍යයන් සහතික විය යුතුය.

8.4.8 ධීවර උපකරණ කොතෙක් දුරට පරිසරයට හා සමාජයට බලපෑමක් ඇති කරන්නේද කියා සොයා බැලීමට රාජ්‍යයන් අධ්‍යනයක් කල යුතුය. විශේෂයෙන්ම සුපරීක්ෂාවට ලක් කල යුත්තේ එවැනි උපකරණ මගින් ජෛව විවිධත්වයට හා වෙරළබඩ ධීවර ප්‍රජාවට සිදුවිය හැකි අහිතකර බලපෑම් පිළිබඳවයි.

## 8.5 ධීවර ආම්පන්න තෝරාගැනීම.

8. 5.1 මත්ස්‍ය හා මත්ස්‍ය නොවන සහ මසුන් ආශ්‍රිත හෝ මසුන් මත යැපෙන ඉලක්ක නොවන ජලජ ජීවීන් වර්ග ඇල්ලීම වැලකීමට හා නාස්තිය ඉවතලෑමටත්, , වඳ වී යාමේ තර්ජනයට මුහුණ පා ඇති මසුන් ඇල්ලීම අවම කිරීම සඳහාත් වරණීය හා ප්‍රායෝගික ආම්පන්න උපයෝගී කර ගත යුතුය. ඒ සඳහා සුදුසු ආම්පන්න හා ඒවායේ තොරතුරු නිර්දේශකර ලබාදීමට රාජ්‍යයන් ඉදිරිපත් වී වරණීය ධීවර ආම්පන්න හා උපක්‍රම සංවර්ධනය කිරීම සඳහා සහය ලබා දිය යුතුය.

8.5.2 වරණීය උපක්‍රම වර්ධනය සඳහා තම නීති හා රෙගුලාසි කෙටුම්පත් කිරීමේදී අදාල රාජ්‍යයන් කර්මාන්තයේ දක්නට ඇති වරණීය ආම්පන්න හා ඒ මත යොදා ගත හැකි උපාය මාර්ග හා උපක්‍රම පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

8.5.3 ධීවර ආම්පන්න තෝරා ගැනීමට, ධීවර ක්‍රම හා උපක්‍රම භාවිතයේ දියුණුවට උපකාරවන ප්‍රමිතීන් අනුකූල ක්‍රමවේදයන් වර්ධනය සඳහා පර්යේෂණ කිරීම යන මේ කරුණු අරභයා රාජ්‍යයන් හා අදාළ ආයතන සහයෝගයෙන් ක්‍රියා කල යුතුය.

8.5.4 තාක්ෂණය හුවමාරුව, පර්යේෂණ ප්‍රතිපල බෙදාහැරීම සහ ධීවර ආම්පන්න තෝරා ගැනීමට පර්යේෂණ වැඩ සටහන් දියත් කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගය ලබා ගැනීම දිරි ගැන්විය යුතුය.

## 8.6 බලශක්තිය උපරිමව ප්‍රයෝජනයට ගැනීම.

8.6.1 ධීවර ක්ෂේත්‍රය තුල අස්වනු නෙලාගැනීමට හා පසු අස්වනු ක්‍රියාකාරත්වය සඳහා වඩාත් කාර්යක්ෂම අයුරින් ශක්තිය භාවිතා කිරීමට යෝග්‍ය පිලිගත් තත්ත්වයන් සහ මහ පෙන්වීම් සංවර්ධනය සඳහා රාජ්‍යයන් පියවර ගත යුතුය.

8.6.2 බලයට අදාල තාක්ෂණ සංවර්ධනය හා හුවමාරුව මගින් ධීවර ක්ෂේත්‍රයේ වැඩි දියුණුව හා විශේෂයෙන්ම යාත්‍රා අයිතිකරුවන් කුලියට ලැබ ගන්නන් හා කළමනාකරුවන් හට තම යාත්‍රාවන්ට බල ශක්තියෙන් උපරිම ප්‍රයෝජන ගත හැකි අන්දමේ උපක්‍රම, උපකරණ සවි කිරීමට උනන්දු කරවීම රාජ්‍යයන් සතු වගකීමකි.

## 8.7 ජලජ පරිසරයේ ආරක්ෂාව

8.7.1 1973 වසරේදී අනුමැතිය ලත් 1978 දී (Protocol වශයෙන්) සංශෝධනය කල, යාත්‍රාවලින් පරිසරය දූෂණය වීම වැලැක්වීමේ ජාත්‍යන්තර සම්මුතිය පදනම් කරගෙන රාජ්‍යයන් නව නීති හා රෙගුලාසි පනවා ක්‍රියාත්මක කළ යුතුය. ( MARPOL 73/78)

8.7.2 MARPOL 73/78 සම්මුතියේ අවශ්‍යතා පරිදි , යාත්‍රා අයිතිකරුවන් කුලියට ගන්නන් හා කළමනාකරුවන් තම යාත්‍රාවලට යෝග්‍ය පරිදි කුණු කසල ඉවත් කිරීමට අවශ්‍ය උපකරණ සවිකර ගත යුතුය. යාත්‍රාවක සාමාන්‍ය ගමනකදී යාත්‍රාගත අපද්‍රව්‍ය හා වෙනත් කුණු කසල ඉවත් කිරීමට ඒ ඒ යාත්‍රාවන්ගේ පංතිය හා ධාරිතාවය අනුව කුණු කසල පුළුස්සා දමන යන්ත්‍රනයක් සවි කර ගත යුතු වේ.

8.7.3 යාත්‍රා අයිතිකරුවන්, කුලියට ගන්නන් හා කළමනාකරුවන් නැව තුළට කුණු කසල එක් වන අන්දමේ යමක් ගැනීමට වෙනොත් එය අවම කිරීම, පිටතදීම ඉවත් කළ හැකි කවර ආවරන ලෙලි ආදිය ඉවත ලෑමට හුරු පුරුදු ඇති කළ යුතුවේ.

8.7.4 MARPOL 73/78 ගිවිසුමෙහි දක්වා ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහන් මට්ටම ඉක්මවා නොයන අන්දමට ක්‍රියා කිරීමට යාත්‍රා සේවක පිරිස් දැනුවත්ව සිටිය යුතුය. මෙම ක්‍රියාවලියට අඩංගු වන්නේ දැවීගිය තෙල්

වැනි අපද්‍රව්‍ය නිකුත් කිරීම හා නිසි ආකාරයෙන් කුණු කසල නැව් තුල රඳවා ගැනීමයි.

## 8.8 වායුගෝලයේ ආරක්ෂාව

8.8.1 යාන්ත්‍රික වායු නිකුත් කිරීමේදී එහි අඩංගු හානිදායක අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීමට රාජ්‍යයන් අදාල ප්‍රමිතීන් හා මඟ පෙන්වීම් උපයෝගී කර ගත යුතුය.

8.8.2 ඕසෝන් ස්ථරය සිදී යාමට තරම් ප්‍රබල අපද්‍රව්‍ය යාත්‍රාවන්නේගේ යන්ත්‍ර සූත්‍ර මඟින් නිකුත් කිරීම අවම කිරීමට උපකරණ, උපක්‍රම යාත්‍රාවන් තුල සවි කර ඇති බවට නැව් හිමියන් කුලියට ගන්නන් හෝ කළමනාකරුවන් සහතික විය යුතුය. මුහුදු යාත්‍රාවන්ගේ ඒ සඳහා යොදා ගන්නා යන්ත්‍ර සූත්‍ර නිසි අන්දමට ක්‍රියා කරවීමට සේවක පිරිස දැනුවත්විය යුතුය.

8.8.3 ක්ලෝරෝ ප්ලුවරෝ කාබනික (CFC) ද්‍රව්‍ය හා මාරුවෙමින් පවතින ද්‍රව්‍යයන් වන හයිඩ්‍රෝ ක්ලෝප්ලුවරෝ කාබනික ද්‍රව්‍ය (HCFC) භාවිතයේදී ඒවා ක්‍රමානුකූලව භාවිතාවෙන් ඉවත් කිරීමට මං සැළැසීමට වග බලා ගත යුතුය. මෙම වර්ග භාවිත වන්නේ අධිශීතකරණ ක්‍රියාකාරීත්වයට නිසා මෙම නියමයන්ට අනුකූල වීමට නැව් නිපදවීම් කර්මාන්තයේ හා ධීවර කර්මාන්තයේ නියැලෙන්නන් හට දැනුම් දී ක්‍රියාත්මක කිරීමට වගබලා ගත යුතුය.

8.8.4 නැව්හිමියන් හා / හෝ කළමනාකරුවන් පවතින යාත්‍රා සඳහා උපයෝගී වන අධිශීතකරණ CFC, HCFC භාවිතය වෙනුවට විකල්ප ද්‍රව්‍ය භාවිතයට යෝග්‍ය පියවරගත යුතුය. ගිණි නිවීමේ උපකරණ සඳහාද Halon වෙනුවට විකල්ප උපකරණ සවි කළ යුතුව ඇත. මෙම නව විකල්ප උපක්‍රම අළුතින් නිපදවන සියළුම යාත්‍රාවන්හි භාවිතා කළ යුතුය.

8.8.5 රාජ්‍යයන්, යාත්‍රා හිමියන්, කුලියට ගන්නන් , කළමනාකරුවන් හා ධීවරයන්

CFC, HCFC Halon ඉවත ලෑමේ දී ජාත්‍යන්තර උපදෙස් මාලාවන් අනුගමනය කළ යුතුය.

## 8.9 ධීවර යාත්‍රාවන් සඳහා වරායන් සහ නැංගුරම් පොලවල්

8.9.1 අනෙකුත් දේ අතර, වරාය හා ධීවර වරාය සැලසුම් කිරීමේදී හා නිර්මාණයේදී රාජ්‍යයන් සැලකිල්ලට භාජනය කළ යුතු ජාත්‍යන්තර ප්‍රමිතීන් පහත දැක්වේ.

A) ධීවර යාත්‍රාවන් නවතා තැබීමට ප්‍රවේශම් සහිත ආවරණ ස්ථාන සපයාදීම හා සේවා පහසුකම් වෙළදුන්ට හා මිලට ගන්නන්ට ලබාදිය යුතුය.

B) ප්‍රමාණවත් පිරිසිදු ජලය ලබා ගැනීමට ඉඩ සලසාදීම සහ සනීපාරක්ෂණ වැඩ පිළිවෙලක් සකසා තිබීම කල යුතුය.

C) දැවී තෙල් හා දැවී තෙල් මිශ්‍ර ජලය ඇතුළු ධීවර ආම්පන්න අප ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ඉඩ කඩ සැලසිය යුතුය.

D) ධීවර නොවන කටයුතු හේතු කොටගෙන බාහිර මාර්ග වලින් පරිසරය අපවිත්‍රවීම සහ ධීවර කටයුතු නිසා පරිසරය අපවිත්‍ර වීම අවම කිරීමට පියවර ගැනීම.

E) පාංශුබාදනය හා වැලි මඩ ආදිය එකතුවීමෙන් සිදුවන හානිය වැලකීමට පිළියෙල කිරීම.

8.9.2 ධීවර යාත්‍රා සඳහා වරාය තැනීමට ස්ථාන තේරීමේදී රාජ්‍යයන් මඟින් ආයතනික රාමුවක් පිහිටුවීම තුළින් ධීවර වරාය සඳහා ස්ථාන තෝරාගැනීම සහ ඒවා වැඩි දියුණුවට පියවර ගත යුතුයි. මෙම ස්ථාන හඳුනාගැනීමේදී වෙරළබඩ ප්‍රදේශ කළමනාකරණය පිළිබඳව වග කිව යුත්තන් හා ආයතන අතර සාකච්ඡා පවත්වා ධීවර ඉදි කිරීම් කිරීමට ඉඩකඩ ලබාගත යුතුය.

## 8.10 වෙරළබඩ ව්‍යුහයන් හා ද්‍රව්‍යයන් අතහැරලීම

8.10.1 ජාත්‍යන්තර සාගර සංවිධානය (IMO) මඟින් හඳුන්වාදී ඇති ප්‍රමිතීන් හා මාර්ගෝපදේශයන් අනුව කිසියම් කාර්යයක් සඳහා යොදා නොගන්නා වෙරළබඩ ව්‍යුහයන් ගලවා ඉවත් කළ යුතුය. එසේම එකී ව්‍යුහයන් ඉවත් කිරීමට පෙර අදාල අධිකාරීන්ගේ උපදෙස් ලබා ගැනීම කළ යුතුය.

## 8.11 කෘතිම කොරල්පර හා මසුන් රාශිභූත කරගැනීමේ උපකරණ

8.11.1. යෝග්‍ය විටදී මත්ස්‍ය සම්පත වැඩි දියුණු කිරීමේ හා මත්ස්‍ය සම්පත් නෙලීම් ඉහල නැංවීම සඳහා පර්යේෂණාත්මක හා සංවර්ධන ප්‍රතිපත්ති දියත් කිරීම රාජ්‍යයන් අනුගමනය කළ යුතුය. මෙම කෘතිම ව්‍යුහයන් දියෙහි හෝ දිය මතුපිට සැදිය යුතුය. මෙම ව්‍යුහයන් නිසා සජීවී මුහුදු සම්පත් වලට සහ පරිසරයට සිදුකරන බලපෑම් අධ්‍යනය කිරීම දියුණු කල යුතුය.

8.11.2 මුහුදු බඩ පරිසරය අපවිත්‍රවීම වැළැක්වීම, නාවිකයන්ගේ ආරක්ෂාව හා භූගෝලීය පිහිටීම සැළැකිල්ලට ගෙන ඊට අදාළව කෘතිම කොරල්පර තැනීමට ඇති අවශ්‍යතාවය තෝරා ගෙන පරිසරයට අදාල ජාත්‍යන්තර සම්මුතීන්හි සඳහන් නියමයන්ට අනුකූලව වැඩ කටයුතු දියත් කිරීමට රාජ්‍යයන් වග බලා ගත යුතුය.

8.11.3 වෙරළබඩ පෙදෙස් කළමනාකරණ සැළසුම් රාමුව තුළ රාජ්‍යයන් මෙකී මසුන් රාශි භූත වන ස්ථාන හා කොරල් පර කළමනාකරණයට යෝග්‍ය කලමනාකරණ ක්‍රම වේදයන් යොදා ගත යුතුය. එහෙත් මේවා නිර්මාණය කිරීමේදී එකී කළමනාකරණ ක්‍රම වේදයන් තුළ කුඩා පරිමාණ මසුන් අල්ලන්නන්ගේ, සුළු පන්න ධීවරයින්ගේ අවශ්‍යතාවය ද සැළකිල්ලට ගත යුතුය.

8.11.4 මුහුදු ගමන්වලට අවශ්‍ය තොරතුරු දැක්වෙන සිතියම් පිළියෙල කරන්නන්ට, වරාය නඩත්තුවට වගකිව යුතු බලධාරීන්ට හා පාරිසරික බලධාරීන්ට මෙම කොරල් පර ඉවත් කිරීම හෝ තැනීම ගැන කලින් අවබෝධ කර දීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

# 9 වෙනි වගන්තිය

## ජලජීවී වගා සංවර්ධනය

9.1 ජාතික බලසීමා තුල වගාව පදනම් කරගත්, ජලජීවී වගා ක්‍රියාකාරීත්වයන් වගකීමක් සහිතව සංවර්ධනය කිරීම.

9.1.1 වගකිව යුතු ජලජීවී වගාව සංවර්ධනය කිරීම පහසු කරන අන්දමේ යෝග්‍ය නීතිමය හා පරිපාලන රටාවක් ගොඩනගා පවත්වා ගැනීම රජයන් විසින් කළ යුතුය.

9.1.2 රාජ්‍යයන් ජලජීවී වගාව සංවර්ධනය හා කළමනාකරණය උනන්දු කරවිය යුතුය. මේ සඳහා ජලජීවී වගාවෙන් ඇතිවන බලපෑමත්, එමගින් ජාන විවිධත්වයටත්, පරිසර පද්ධතියේ ඒකග්‍රතාවයටත්, ඇති කරන බලපෑම පිළිබඳව පූර්ව තක්සේරුවක් කිරීමට අදාල විද්‍යාත්මක තොරතුරු පදනම් කරගත යුතුය.

9.1.3 ජලජීවී වගා සංවර්ධනයේ උපාය මාර්ග හා සැලසුම් නිතර විමර්ශනය කළ යුතු අතර එම ක්‍රියාකාරකම් පරිසරයේ ධාරණීය පැවැත්මට ඔරොත්තු දෙයිද කියාත් ජලජීවී වගා කටයුතු හා අනෙකුත් ක්‍රියාකාරකම් තාර්කිකව උපයෝගී වේද කියාත් රාජ්‍යයන් ස්ථිර වශයෙන් සොයා බැලිය යුතු අතර ඒවා ප්‍රසිද්ධ කිරීමද කළ යුතුයි.

9.1.4 ජලජීවී වගා සංවර්ධනයෙන් අදාල ප්‍රදේශයන්හි ජනතාවගේ ජීවිකා වෘත්තියට හා මත්ස්‍ය බිම් කරා ඔවුනට යාමට ඇති ඉඩකඩට අහිතකර බලපෑම් ඇති වීම රාජ්‍යයන් මගින් වළක්වාලිය යුතුය.

9.1.5 ජලජීවී වගාවට යෝග්‍ය පාරිසරික අධීක්ෂණය හා තක්සේරු ක්‍රම ගොඩනැඟීමෙන් ඒවායින් සිදුවන අහිතකර පාරිසරික බලපෑම් අවම කළ යුතු අතර, ආර්ථික හා සමාජීය බලපෑම් ද අවම කිරීමට අදාල රජයයන් පියවර ගත යුතුය. මෙහිදී සිදුවන අපද්‍රව්‍ය බැහැර කිරීම, ජලය ජලජීවී වගාවට යොදා ගැනීම, රසායන ද්‍රව්‍ය හා බෙහෙත් භාවිතයද, භූමිය උපයෝගී කර ගැනීම පිළිබඳවද දැඩි අවධානය යොමු කල යුතුය.

## 9.2 **දේශ සීමා වලින් පිටත පිහිටි ජලජ පරිසර පද්ධතිය තුළ අභිවර්ධනය පදනම් කරගත් ධීවර කටයුතු ඇතුළු ජලජීවී වගාව වගකීමකින් සංවර්ධනය කිරීම.**

9.2.1 දේශ සීමා තුළ වගකීමක් සහිතව ජලජීවී කටයුතු දියත් කිරීම සඳහා සහයෝගය දක්වමින් හා ධරණීය ජලජීවී ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීම මගින් දේශසීමාවලට පිටතින් පරිසර පද්ධතිය ආරක්ෂා කිරීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

9.2.2 දේශසීමා වලින් පිටත , ඒවාට යාබද ජලජ පරිසර පද්ධති ආරක්ෂා කිරීමට රාජ්‍යයන් පියවර ගත යුතුය. එසේම එය කළ යුත්තේ ජාත්‍යන්තර නීතියට අනුකූලව, තෝරා ගන්නා මත්ස්‍ය වර්ගයන් වගකීමෙන් අල්ලන බවටත්, ජලජීවී වගා ව්‍යාපෘති පිහිටුවීමෙන් හා කලමණාකරණයෙන් ජලජීවී වගාවන් මගින් දේශ සීමා ඔබ්බෙහි ඇති ජලජ පරිසර පද්ධතීන්ට හානියක් නොවන බවටත් සහතික වීමෙන් පසුවය.

9.2.3 සුදුසු පරිදි දේශ සීමා ඔබ්බෙහි ඇති ජලජ පරිසර පද්ධතීන්ට එම ප්‍රදේශයන්ට ආවේනික නොවූ මත්ස්‍ය වර්ග හඳුන්වාදීමට පෙර රාජ්‍යයන් තම අසල්වාසී රාජ්‍යයන් සමඟ සාකච්ජා කර උපදෙස් ලබාගත යුතු වේ.

9.2.4 ජලජීවී වගා කටයුතු වලට අදාල දත්ත හා ප්‍රවෘත්ති ජාලයක් ඇති කොට තම රාජ්‍යයන්හි ජලජීවී කටයුතු පිළිබඳ තොරතුරු බෙදා හැරීමට සුදුසු යන්ත්‍රණ පිහිටුවා සැළසුම් පිළිබඳ අදහස් උදහස් හුවමාරුවට ජාතික , උප කලාපීය, කලාපීය හෝ අන්තර් ජාතික මට්ටමින් ඉඩකඩ ලබාදීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

9.2.5 අවශ්‍යවිටදී ජලජීවී පැවැත්මට යෝග්‍ය යෙදුම් මැන බලා ගැනීමට හා අධීක්ෂණයට සුදුසු යාන්ත්‍රණ සැකසීම සඳහා රාජ්‍යයන් සහයෝගයෙන් කටයුතු කල යුතුය.

## 9.3 **ජලජීවී වගාව සඳහා (වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තයද ඇතුළුව ) ජලජ ජාන සම්පත් උපයෝගී කර ගැනීම**

9.3.1 රාජ්‍යයන්, ජාන විවිධත්වය ආරක්ෂා කල යුතුවාසේම යෝග්‍ය කළමනාකාරිත්වය මගින් ජලජ ප්‍රජාවන්ගේ හා පරිසර පද්ධතීන්ගේ ඒකාග්‍රතාවයද පවත්වා ගත යුතුය. විශේෂයෙන්ම දේශීය නොවන විශේෂයන් හදුන්වා දීමේදී හා ජානමය වෙනසකට ලක්කල මත්ස්‍යයින් හා ජලජජීවීන් විවිධ රටවලට හඳුන්වාදීමේදී , හානිය අවම වන පරිදි පියවර ගත යුතුය. විශේෂයෙන්ම මෙහිදී ප්‍රවේශම් විය යුත්තේ සැලකිලිමත් අයුරින් එම මත්ස්‍ය වර්ග ඇතිවූ රටේ නීත්‍යානුකූල දේශ සීමාවින් ඉක්මවා වෙනත් ජල සීමා දක්වා එම විශේෂ පැතිර යාම වළකා ගැනීමටයි. හැකි සෑම අවස්ථාවකදීම, වගාවන් ගෙන් පැන ගිය මත්ස්‍ය වර්ග විසින් ස්වභාවික මත්ස්‍යයින්ට පතුරුවාලිය හැකි රෝග හා වෙනත් දුෂ්කරතා හැකි තාක් දුරට අවම කිරීමට රාජ්‍යයන් උත්සාහ ගත යුතුය.

9.3.2 ජලජජීවීන් හදුන්වාදීමට හා හුවමාරුවට ජාත්‍යන්තර පිළිවෙත් පද්ධති හා ක්‍රියාවලි උපුටා ගැනීමේදී හා ක්‍රියාවට නැංවීමේදී රාජ්‍යයන් අතර සහයෝගීතාවය වර්ධනය කළ යුතු වේ.

9.3.3 වගා කරගත් හා ස්වභාවික මසුන්ට වැළඳෙන හෝ වැළඳිය හැකි රෝග කාරක හා වෙනත් දුෂ්කරතා අවම කරගැනීමට රාජ්‍යයන් තම මාතෘ මත්ස්‍ය ගහනයේ ජාන ශක්තිය වර්ධනය කර ගත යුතුය. ඒ සමඟම ප්‍රදේශයට ආවේනික නොවූ විශේෂයන් හඳුන්වාදීම සහ නිෂ්පාදනයේදීත් මාතෘ මත්ස්‍ය ගහණය හෝ සජීවී මසුන්, කීටයින් හෝ පැටවුන් අලෙවියේදී හා ප්‍රවාහණයේදීත් යෝග්‍ය ක්‍රියාවලි හා වෙනත් ජීවමාන මත්ස්‍ය හුවමාරුවේදීත් මේවා උපයෝගී කර ගැනීමට රාජ්‍යයන් උනන්දු විය යුතුය. මේ උදෙසා සුදුසු ආචාරධර්ම පද්ධතීන් හා ක්‍රියාවලි පිළියෙල කිරීමට හා දියත් කිරීමටද රාජ්‍යයන් විසින් පහසුකම් සලසා දිය යුතුව ඇත.

9.3.4 මාතෘ මත්ස්‍යයින් තේරීමේදී හා බිත්තර නිෂ්පාදනයේදීත්, කීටයින් හා කුඩා පැටවුන් නිෂ්පාදනයේදීත් රාජ්‍යයන් විසින් යෝග්‍ය ක්‍රියාවලි ප්‍රචලිත කළයුතුය.

9.3.5 වඳවී යාමේ තර්ජනයට මුහුණදී සිටින මත්ස්‍ය විශේෂයන් ආරක්ෂා කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ගේ ගහණය වර්ධනය කිරීම සඳහාත් තර්ජනයට ලක්ව ඇති මත්ස්‍යයින්ගේ ජාන විවිධත්වය සංරක්ෂණය කිරීම පිළිබඳව ඇති වැදගත් කම සලකා එවැනි විශේෂ වගා කිරීමට සුදුසු පර්යේෂණ දියත් කිරීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

## 9.4 නිෂ්පාදන මට්ටමේ දී වගකිව යුතු ජලජීවී වගාව

9.4.1 ධීවර ප්‍රජාවන්, නිපැයුම් සංවිධාන, හා ජලජීවී වගාවේ යෙදෙන්නන් උදෙසා වගකිව යුතු ජලජීවී වගා පිළිවෙත් රාජ්‍යයන් විසින් ප්‍රචලිත කළ යුතුය.

9.4.2 වගකිවයුතු ජල වී කළමනාකරණ පිළිවෙත් සංවර්ධනයෙහි ලා රාජ්‍යයන් විසින් ධීවරයින් සහ ඔවුන්ගේ ප්‍රජාවන් ගේ ක්‍රියාකාර සහභාගීත්වය වර්ධනය කල යුතුය.

9.4.3 පොහොර ඇතුළු සුදුසු මත්ස්‍ය ආහාර, සහ මත්ස්‍ය ආහාරයට එක්කල යුතු අමතර පෝෂණ ද්‍රව්‍ය තෝරා ගැනීමේ උත්සාහයන් ප්‍රචලිත කිරීම රාජ්‍යයන් මගින් කල යුතුය.

9.4.4 වගාබිම් හා මත්ස්‍ය සෞඛ්‍යය කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීමේදී සෞඛ්‍ය සම්පන්න ක්‍රියාවලින් හා එන්නත්හි කාර්යක්ෂමතාව වර්ධනයට රාජ්‍යයන් පියවර ගත යුතුය. ආරක්ෂිත, කාර්යක්ෂම සහ අවම ප්‍රමාණවලින් යුතු හෝර්මෝන, ප්‍රතිජීවක හා රසායන ද්‍රව්‍ය භාවිතා කිරීමට ධීවරයින් උනන්දු කරවීමට රාජ්‍යයන් සහතික විය.

9.4.5 ජලජීවී වගාවේ දී ජනතා සෞඛ්‍යයට හා පරිසරයට අහිතකර රසායනික ද්‍රව්‍ය යෙදීම් මනාව පාලනය කර භාවිතා කිරීමට රාජ්‍යයන් කටයුතු යෙදිය යුතුය.

9.4.6 බොකු බඩවැල්, ගොහොදු මඩ, මියගිය හෝ රෝගී මසුන් අතිරික්ත පශුවෛද්‍ය ඖෂධ හා වෙනත් අහිතකර රසායනික අපද්‍රව්‍ය පරිසරයට හා මිනිසාට අහිතකර නොවන පරිදි ඉවත් කළ යුතුවේ.

9.4.7 ආහාර සුරක්ෂිතභාවය තහවුරු වනසේ අස්වනු නෙලා ගැනීමට පෙර හා අස්වනු නෙලාගැනීමේදීත්, ක්ෂේත්‍රයේ ආහාර නිෂ්පාදනයේදීත්, ගබඩා කිරීමේදී සහ ප්‍රවාහනයේදීත් ආහාරයේ ගුණාත්මක භාවය හා වටිනාකම වර්ධනය වනසේ ක්‍රියාකිරීමට රාජ්‍යයන් උත්සාහ ගත යුතුය.

## 10 වෙනි වගන්තිය

## වෙරළාසන්න පෙදෙස් කළමනාකරණය, ධීවර කටයුතු හා ඒකාබද්ධ කිරීම

### 10. 1 ආයතනික රාමුව

10.1.1 වෙරළාසන්න ප්‍රදේශයන්හි අස්ථායිභාවය හා සංවේදීතාවයත්, වෙරළාසන්න ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවයත්, ස්වභාවික සම්පත්හි සීමිත භාවයත් සැලකිල්ලට ගනිමින් ඒවායේ තිරසාරභාවයටත් ඒකාබද්ධ සම්පත් භාවිතය සඳහා යෝග්‍ය වන පරිදි ප්‍රතිපත්තිමය, නීතිමය හා ආයතනික රාමුවක් සැකසීම සහතික කිරීම සඳහා රාජ්‍යයන් පියවර ගත යුතුය.

10.1.2 වෙරළාසන්න පෙදෙස්හි විවිධාකාරවූ භාවිතය අරභයා තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී හා වෙරළාසන්න පෙදෙස් කළමනාකරණය, සැළසුම් හා සංවර්ධනය යන කටයුතුවලදීත්, ධීවර අංශයේ නියෝජිතයන් හා ධීවර ප්‍රජාවද සහභාගි කර ගැනීමට රාජ්‍යයන් සහතික විය යුතුය.

10.1.3 වෙරළාසන්න ප්‍රදේශයන්හි සම්පත් භාවිතය පිළිබඳ තීරණය කිරීමේදී වෙරළාසන්න ධීවර ජනතාවගේ අයිතීන් හා ඔවුන්ගේ පාරම්පරික ක්‍රියාකාරකම් සැලැකිල්ලට ගනිමින් තිරසාර සංවර්ධනයක් ළඟා කිරීමට ඉවහල් වන පරිදි යෝග්‍යවූ ආයතනික සහ නීතිමය රාමු සකසා ඒවා සුදුසු පරිදි භාවිතා කිරීමට යොමුකිරීම රාජ්‍යයන්හි වගකීමකි.

10.1.4 ධීවර සම්පත් භාවිතා කරන්නන් අතරම හා ඔවුන් සමඟ වෙරළාසන්න ප්‍රදේශයන්හි සම්පත් භාවිතා කරන වෙනත් අය අතරත් ධීවර කටයුතු ආශ්‍රිත ආරවුල් වැලකීම සඳහා රාජ්‍යයන් මගින් පියවර ගත යුතුය.

10.1.5 ධීවර ජනතාව අතරම ඇතිවන ගැටුම් වැලකීමටත්, වෙරලබඩ ප්‍රදේශයේ ධීවර කටයුතු වල නියැලෙන්නන් හා වෙනත් සම්පත් භාවිතා කරන්නන් අතර ඇතිවන ගැටුම් වැලකීම සඳහා යෝග්‍ය පරිපාලන මට්ටමේ යාන්ත්‍රණයක් හා ක්‍රියාවලියක් ඇති කිරීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

## 10.2 ප්‍රතිපත්තිමය පියවර

10.2.1 වෙරලාසන්න සම්පත් ආරක්ෂාව හා කලමනාකරණයේ අවශ්‍යතාව පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට පියවර ගැනීමත් කලමනාකරණ ක්‍රියාවලියට ඔවුන් හවුල් කර ගැනීමටත් රාජ්‍යයන් ක්‍රියා කල යුතුය.

10.2.2 වෙරලාසන්න සම්පත් පරිහරනයට හා වෙන්කර දීමට තීරණ ගැනීම පහසුවනසේ ඒවායේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික සාධක පිළිබඳව තක්සේරු කර ඒවායේ ඇගයීමක් කිරීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

10.2.3 වෙරලාසන්න පෙදෙස් කලමනාකාරත්වය උදෙසා ප්‍රතිපත්ති තීරණය කිරීමේදී එම ප්‍රදේශයන්හි අවිනිශ්චිතතා හා අවදානම් තත්ත්වය සැලකිල්ලට ගැනීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

10.2.4 වෙරලාසන්න ප්‍රදේශ කලමනාකරණ ක්‍රියාවලියේදී වෙරලාසන්න පරිසරය අධීක්ෂණය කිරීම සඳහා උපක්‍රම සැකසීමට හෝ පවතින ඒවා වර්ධනය කිරීමට තම හැකියාවන් අනුව රාජ්‍යයන් පියවර ගත යුතු අතර එහිදී භෞතික, රසායනික , ජෛව විද්‍යාත්මක , ආර්ථික හා සමාජ්‍ය මාන භාවිතයෙන් එය කල යුතුය.

10.2.5 වෙරලාසන්න පෙදෙස් කලමනාකාරත්වයට සහය වීම සඳහා බහු විධ පර්යේෂණ දියත් කල යුතු වේ. මෙහිදී විශේෂයෙන්ම සලකා බැලිය යුත්තේ ඒවායේ පාරිසරික, ජීව විද්‍යාත්මක, සමාජ, ආර්ථික, නීතිමය හා ආයතනික ක්‍රියාවලීන්ය.

## 10.3 කලාපීය සහයෝගිතාවය

10.3.1 සමීප වෙරළාසන්න රාජ්‍යයන් සහිත රටවල්, වෙරළාසන්න සම්පත්හි තිරසාර භාවිතයට හා පාරිසරික සංරක්ෂණය සඳහා එකිනෙකා අතර සහයෝගයෙන් කටයුතු කල යුතුය.

10.3.2 වෙරළාසන්න ප්‍රදේශයන්හි සිදුවිය හැකි අන්තර් රාජ්‍ය අහිතකර පාරිසරික ක්‍රියාකාරිත්වයන්හිදී රාජ්‍යයන්,

(අ) බලපෑම් සිදුවිය හැකි රාජ්‍යයන්ට හැකිනම් කලින් දැනුම් දීම හෝ දැනගත් විගසම තොරතුරු දැනුම්දීම,

(ආ) අදාල රාජ්‍යයන් මගින් හැකි මුල්ම අවස්ථාවේදී උපදෙස් ලබා ගැනීමට ක්‍රියා කිරීම, කල යුතුය.

10.3.3 වෙරළාසන්න ප්‍රදේශ කළමනාකරණය වර්ධනය කිරීම උදෙසා උපකලාපීය, කලාපීය මට්ටමින් රාජ්‍යයන් සහාය දැක්විය යුතුය.

## 10.4 ක්‍රියාත්මක කිරීම

10.4.1 වෙරළාසන්න පෙදෙස් සැලසුම් කිරීම, සංරක්ෂණය, කළමනාකරණය, සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම පහසු කරලනු වස්, මෙම කටයුතුවල නියැලි විවිධ ජාතික අධිකාරීන් අතර සහයෝගිතාවය හා සම්බන්ධීකරණය ඇති කරලීමට රාජ්‍යයන් මගින් අවශ්‍ය යන්ත්‍රණ ඇති කළ යුතුය.

10.4.2 වෙරළාසන්න කළමනාකරණ ක්‍රියාවලියේදී , ධීවර අංශය නියෝජනය කරන ආයතන හෝ ආයතනයන්ට අවශ්‍ය වන තාක්ෂණික දැනුම හා මූල්‍යමය පහසුකම් තිබීම ගැන රාජ්‍යයන් සහතික විය යුතුය.

## 11 වෙනි වගන්තිය
## පසු අස්වනු ක්‍රියාවලිය හා වෙළඳාම

### 11.1 වගකීමකින් යුතුව ධීවර සම්පත් උපයෝගී කර ගැනීම

11.1.1 මත්ස්‍ය නිෂ්පාදන ආරක්ෂාකාරීව හා හොඳ තත්වයේ පවතින මසුන් පාරිභෝගිකයාට ලැබීම පාරිභෝගික අයිතියක් වන අතර එය සහතික කිරීමට රාජ්‍යයන් සුදුසු පියවර ගත යුතුවේ.

11.1.2 වාණිජමය හොර මගඩි මැඩලීමට හා පාරිභෝගික සෞඛ්‍ය ආරක්ෂාව සැලසීම උදෙසා මෙන්ම මත්ස්‍ය නිෂ්පාදනයේ ගුණාත්මක භාවිතය ස්ථිර කිරීමේ ජාතික ආරක්ෂක ක්‍රම රාජ්‍යයන් පවත්වාගෙන යා යුතුය.

11.1.3 මත්ස්‍ය නිෂ්පාදන වල ආරක්ෂාව හා තත්වය සහතික කිරීම සඳහා අවම ප්‍රමිතීන් සැකසීමත්, කර්මාන්තය පුරා මෙම ප්‍රමිතීන් පවත්වා ගැනීමටත් රාජ්‍යයන් පියවර ගත යුතුය. මේවා මගින් ගුණාත්මක ප්‍රමිතීන් වර්ධනයට හා ක්‍රියාවට නැංවීම ඇලිමන්ටේරියස් කොමිසමේ සහ අනෙකුත් අදාල සංවිධාන ක්‍රියාකාරිත්වයට අනුකූලව විය යුතුය.

11.1.4 සුදුසු පරිදි ජාතික සනීපාරක්ෂක සහ සහතික කිරීමේ වැඩ සටහන්හි අන්‍යොන්‍ය හෝ ඒකාග්‍රතාවයක් හෝ ඒ දෙකම ඇතිවිය යුතුය. එසේම යෝග්‍ය පරිදි අන්‍යොන්‍ය පිළිගැනීමක් සහිත පාලනය කළ හැකි හා සහතික කිරීමේ හැකියාව සහිත ආයතන පිහිටුවීමේ හැකියාව සොයා බැලීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

11.1.5 ධීවර සම්පත් උපයෝගී කර ගැනීමේදී හා තිරසාර සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති සැකසීමේදී පසු අස්වනු ධීවර ක්ෂේත්‍රයේ සමාජය හා ආර්ථික ක්‍රියාකාරිත්වය පිළිබඳව අවශ්‍ය අවධානය ලබාදීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

11.1.6 මත්ස්‍ය නිෂ්පාදන තාක්ෂණයට හා ගුණාත්මක බව ස්ථිර කිරීමට අදාල හා පසු අස්වනු මත්ස්‍ය භාවිතය වර්ධනය කරන පර්යේෂණ කටයුතු සඳහා රාජ්‍යයන් හා අදාල සංවිධාන අත දිය යුතුය. මෙහිදී මෙම ව්‍යාපෘතීන් හි සමාජ , ආර්ථික, පාරිසරික හා පෝෂණ බලපෑම පිළිබඳව විශේෂයෙන්ම සලකා බැලිය යුතුය.

11.1.7 රාජ්‍යයන් විසින් විවිධ නිෂ්පාදන ක්‍රම සැලකිල්ලට භාජනය කර , පහසුකම් සැලසීම හා සහයෝගීතාවය තුලින් යෝග්‍ය තාක්ෂණය සංවර්ධනය කිරීම හා ඒවා හුවමාරු කිරීම වැනි පහසුකම් සැලසීම මගින් මත්ස්‍ය සම්පත් සැකසීම, ප්‍රවාහණය, ගබඩා කිරීම වැනි කටයුතු පාරිසරිකව හිතකරව සිදුවේදැයි නිරන්තරයෙන් නිරීක්ෂණය කල යුතුය.

11.1.8 මසුන් සැකසීමේ, බෙදා හැරීමේ හා අලෙවියේ නියැලෙන්නන් දිරිගැන්වීම සඳහා රාජ්‍යයන් මගින්,

පශ්චාත් අස්වනු හානිවීම් හා නාස්තිය අඩුකිරීමටත්,

වගකිවයුතු ධීවර කළමනාකරණ පුරුදු අනුකූලව අතුරු අස්වනු නෙලාගන්නා කටයුතු වල යෙදේද යන්නත්,

පරිසරයට යෝග්‍ය පරිදි සම්පත් භාවිතයට විශේෂයෙන්ම ජලය හා බලශක්තිය උපයෝගි කර ගැනීමත්, එහිදීත් දැව භාවිතා කිරීම කෙසේ කෙරෙත්ද යන්නත් රාජ්‍යයන් විසින් සොයා බැලිය යුතු වේ.

11.1.9 සුදුසු අවස්ථාවන්හිදී මත්ස්‍ය අනුභවය උනන්දු කරවිය යුතු අතර මනුෂ්‍යයන්ට එහි අඩංගු පෝෂ්‍ය පදාර්ථයන් පෙන්වාදී යෝග්‍ය පරිදි මත්ස්‍ය ආහාර පරිභෝජනයට ගැනීම උදෙසා දිරි ගැන්වීම රාජ්‍යයන් සතු යුතුකමකි.

11.1.10 සංවර්ධනය වෙමින් පවතින රටවල ඇති වටිනාකම් එකතුකල නිෂ්පාදන (Value Added Products) සඳහා පහසුකම් සපයා දීමට රාජ්‍යයන් උදව් කළ යුතුය.

11.1.11 වෙළඳාමේ යොදන මසුන්ගේ හා මත්ස්‍ය නිෂ්පාදයන්හි සම්භවය හඳුනා ගැනීමේ හැකියාව දියුණු කිරීම තුලින් ජාත්‍යන්තර හා දේශීය මත්ස්‍ය වෙළඳාම තුළ නිවැරදි සංරක්ෂන හා කළමනාකරණ පුරුදු පවත්වා ගනීද යන්න රාජ්‍යයන් විසින් සොයා බැලිය යුතුය.

11.1.12 වෙළඳපොළ කටයුතු අවුල් නොකරන පරිදි පසු අස්වනු තාක්ෂණයට අදාල පාරිසරික නීති රෙගුලාසි සහ ප්‍රතිපත්ති සැකසීම සඳහා අදාල රාජ්‍යයන් විසින් සොයා බැලිය යුතුය.

## 11.2. වගකීමකින් යුතු ජාත්‍යන්තර වෙළඳාම

11.2.1වර්තමාන ආචාර ධර්ම පද්ධතියේ සඳහන් විධි-විධාන සහ අර්ථදැක්වීම් උපයෝගී කර ගැනීමේදී (WTO) ලෝක වෙළඳ සංවිධානයේ ගිවිසුමේ සඳහන් මූලධර්ම, අයිතීන් හා වගකීම් වලට එකඟව අදාල කර ගත යුතුය.

11.2.2ජාත්‍යන්තර මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ද්‍රව්‍ය වෙළඳාම මගින් තිරසාර ධීවර සංවර්ධනය හා සජීවී ජලජ සම්පත් වගකීමකින් යුතුව පරිහරනය කිරීම අවදානමට ලක් නොකල යුතුය.

11.2.3ජාත්‍යන්තර මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනයන් වෙළඳාමට අදාල පියවරයන් විනිවිද පෙනෙන ලෙසත්, අදාළ සෑම අවස්ථාවකදීම විද්‍යානුකූල සාක්ෂි මත පදනම්ව සහ, ජාත්‍යන්තර වශයෙන් එකඟතාවියට පැමිණි නීති වලට එකඟව ක්‍රියාත්මක වීමට රාජ්‍යයන් සහතික විය යුතුය.

11.2.4මානව හා සත්ව ජිවිතයන්හි සෞඛ්‍යය ආරක්ෂාව සඳහාත්, පාරිභෝගික අවශ්‍යතා හෝ පාරිසරික ආරක්ෂාව සඳහාත් රාජ්‍යයන් විසින් ගනු ලැබූ ධීවර වෙළඳාම් උපක්‍රම ජාත්‍යන්තර වෙළඳාමට හානිකර නොවිය යුතු අතර, ජාත්‍යන්තර වශයෙන් එකඟවූ වෙළඳ නීතිවලට අනුව සැකසිය යුතුය. මෙහිදී විශේෂයෙන්ම ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාමට ඇති තාක්ෂණික

බාධකයන්හි සෞඛ්‍ය හෝ භෞතික සෞඛ්‍ය තත්වයන්හි එකඟතා විශේෂයෙන්ම එහි මූලධර්මය, අයිතිය හා මිනෑකමට හානි නොවන පරිදි සැකසිය යුතුය.

11.2.5 ධීවර හා ධීවර නිෂ්පාදන ද්‍රව්‍ය අලෙවියට හානියක් හෝ බාධාවක් වේනම් අදාල රාජ්‍යයන් මගින් තවදුරටත් වෙළදපළ නිදහස් කරදීමට පියවර ගත යුතුය. මෙහිදී තීරුබදු, කෝටා ක්‍රම, තීරුබදු නොවන බාධක ධීවර වෙළදාම පුළුල් කිරීමට බාධාවක් වේ නම් ලෝක වෙළද සංවිධානයේ (WTO) ගිවිසුම් ප්‍රකාර එහි මූලධර්මයට, අයිතීන්ට හා අවශ්‍යතාවයට අනුව එහි සදහන් නීතිරීති උල්ලංඝණය නොවන ලෙසට ඉවත් කළ යුතුය.

11.2.6 වෙළදාම තුළ වෙළදපොළ ප්‍රවේශය ඇහිරීම හෝ පාරිභෝගිකයාට තම සැපයුම්කරු තෝරා බේරා ගැනීමේ නිදහස සීමා කිරීම වැනි අනවශ්‍ය හෝ සැහවුණු බාධක සෘජුව හෝ වක්‍රව රාජ්‍යයන් විසින් ක්‍රියාවට නැංවිය යුතු නැත.

11.2.7 සම්පත් හෝ වෙළදපොළ ප්‍රවේශයට රාජ්‍යයන් පූර්ව කොන්දේසි යොදා ගත යුතු නැත. කෙසේ වෙතත් මෙයට රාජ්‍යයන් අතර ධීවර කටයුතු පිළිබද ගිවිසුම් අදාල නොවේ. එම ගිවිසුම්හි යම් විධි විධාන සම්පත් ප්‍රවේශයට, වෙළදාමට හා වෙළදපොළ ප්‍රවේශයට, තාක්ෂණ හුවමාරුවට විද්‍යාත්මක පර්යේෂණ පුහුණුවට හෝ වෙනත් අදාළ කරුණු ගැන සදහන් වෙතොත් එවන් සටහන් ඉහත ප්‍රකාශයට අයත් නොවේ.

11.2.8 සුවිශේෂ තාක්ෂණය හෝ වෙනත් නව නිපැයුම් මිලට ගැනීම, වෙළදපොළ ප්‍රවේශයට සම්බන්ධ නොකිරීමට රාජ්‍යයන් ක්‍රියා කළ යුතුය.

11.2.9 අවදානමට ලක්වී ඇති මසුන් වර්ග පිළිබදව වෙළදාම හසුරුවන ආකාරය අදාළ ජාත්‍යන්තර ගිවිසුම් හා අනුකූළ දැයි සෙවීමට රාජ්‍යයන් සහයෝගය දිය යුතුය.

11.2.10 ජීවමාන මත්ස්‍ය ආදර්ශයන් ආනයනය හෝ අපනයනය කරන රටවල් හි සිදුවිය හැකි පාරිසරික හානියේ අවදානම සැලකිල්ලට ගනිමින්, ඒවායේ වෙළදාමට අදාල ජාත්‍යන්තර ගිවිසුම් සැකසීමට රාජ්‍යයන් ක්‍රියා කල යුතුය.

11.2.11 මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ද්‍රව්‍යයන්, සජීවී ජලජීවී සම්පත් සංරක්ෂණයට අදාල ජාත්‍යන්තර ප්‍රමිතීන් කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීම වර්ධනය කිරීම උදෙසාත් රාජ්‍යයන් සහයෝගය දැක්විය යුතුය.

11.2.12 වෙළදාමේ හා ආයෝජනයේ ප්‍රතිලාභ ලබාගැනීම උදෙසා සජීවී ජලජ සම්පත් සංරක්ෂණය සදහා වන පියවර අඩාල කිරීමට රාජ්‍යයන් විසින් පියවර නොගත යුතුය.

11.2.13 ලෝක වෙළද සංවිධානයේ (WTO) මූලධර්මයන්, ප්‍රතිපත්ති, අයිතිවාසිකම් වලට එකහව මත්ස්‍ය නිෂ්පාදන හෝ මත්ස්‍ය වෙළදාමේ දී බලපාන ජාත්‍යන්තරව පිළිගතහැකි නීති හෝ ප්‍රමිතීන් සැකසීමට රාජ්‍යයන් සහයෝගය දිය යුතුය.

11.2.14 මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන සමානව හා සාධාරණව වෙළදාමේ නිරතවීම සදහාත්, ධීවර සංරක්ෂණය සදහා බහුපාක්ෂිකව එකහවූ පියවරයන් ක්‍රියාත්මක කිරීමටත්, කලාපීය හෝ ලෝක වෙළද සංවිධානය වැනි බහුපාක්ෂික ආයතන සමහ සහයෝගයෙන් හා ක්‍රියාකාරීව සහභාගිවීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

11.2.15 විවිධ රාජ්‍යයන්, ණය ආධාර සපයන ආයතන, බහු පාක්ෂික සංවර්ධන බැංකු හෝ වෙනත් ජාත්‍යන්තර සංවිධාන ජාත්‍යන්තර මත්ස්‍ය වෙළදාම හෝ අපනයන නිෂ්පාදනය වර්ධනය කිරීම පිළිබදව ප්‍රතිපත්ති සැකසීමේදී අදාල රටවල සිදුවන පාරිසරික හානිය හෝ ජනතාවගේ පෝෂණ

අයිතියට ඇතිවන අහිතකර බලපෑම, සෞඛ්‍යයට හා ජනතාවගේ මනා පැවැත්මට මත්ස්‍ය සම්පත් බලපාන ආකාරය , සැලකිල්ලට ගත යුතුය.

මෙහිදී තම ජනතාවගේ පෝෂණ අවශ්‍යතාවයන්, සැලකිල්ලට ගනිමින් වෙනත් සංසන්දනාත්මක පහසු පෝෂ්‍ය ආහාර මාර්ගයක් නොපවතී නම් හෝ මිලදී ගත හැකි මට්ටමක නොපවතී නම් එවැනි අවස්ථා පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

## 11.3 මත්ස්‍ය වෙළඳාමට අදාල නිති හා රෙගුලාසි

11.3.1 ජාත්‍යන්තර මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වෙළඳාමට අදාල වන නීතිරීති, රෙගුලාසි හා පරිපාලන ක්‍රියාවලිය විනිවිද පෙනන සුළු මෙන්ම හැකිතාක් සරල ද විය යුතුය. තවද එය සුදුසු අවස්ථාවන්හිදී විස්තරාත්මක විය යුතුවා සේම විද්‍යාත්මක සාක්ෂි මත පදනම් කර ගත යුතුය.

11.3.2 රාජ්‍යයන් තම ජාතික නීතියට අනුකූලව ධීවර කර්මාන්තය පිළිබඳව සුදුසු උපදේශකත්වය සහ සහභාගිත්වය ලබා දිය යුතුය. එමෙන්ම මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වෙළඳාමට අදාළව නීති ක්‍රියාත්මක කිරීමේදී හා සැකසීමේදී පාරිසරික සහ පාරිභෝගික කණ්ඩායම් වල සහයෝගයද ලබා ගත යුතුවේ.

11.3.3 නීතිය අඩු ලුහුඬුකමකින් තොරව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමටත් මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වෙළඳාමට අදාළ නීති රෙගුලාසි හා පරිපාලන ක්‍රියාවලි සරළව සකස් කිරීමටත් රාජ්‍යයන් ක්‍රියාකළ යුතුය.

11.3.4 වෙනත් රාජ්‍යයන් හා සිදුකරන මත්ස්‍ය වෙළඳාමට බලපාන නීතිමය අවශ්‍යතා වෙනස් කරන ලෙසට යම් රජයක් යෝජනා කරයිනම්, අදාල රාජ්‍යයට හා නිෂ්පාදකයන්ට යෝග්‍ය පරිදි තම ක්‍රියාවලියේ හා ක්‍රියාපටිපාටියේ වෙනස්කම් ඇති කිරීමට සහාය වීම පිණිස ඒ පිළිබඳව කල්වේලා ඇතිව දැනුම් දිය යුතුය. මේ සම්බන්ධයෙන් බලාපොරොත්තු වන වෙනස් කම් සිදු කිරීම සඳහා එය බලපාන රාජ්‍යයන් හා සාකච්ඡා කොට කාල රාමුවක් නියම කර ගැනීම යෝග්‍ය වේ. තාවකාලිකව තම යුතුකම් වලින් බැහැරව ක්‍රියා කිරීමට සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් ඉල්ලීමක් කලහොත් එයට ප්‍රමුඛත්වය දී සැලකිල්ලට භාජනය කළ යුතුවේ.

11.3.5 ජාත්‍යන්තර මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වෙළඳාමට අදාළ නීතිරීති හා රෙගුලාසි රාජ්‍යයන් මගින් විටින් විට විමර්ශණය කළ යුතු අතර එමගින් එම නීති හඳුන්වාදීමේදී පැවති අවශ්‍යතාවයන් තවදුරටත් වලංගුදැයි තීරණය කළ යුතුය.

11.3.6 ජාත්‍යන්තරව පිළිගත් විධි විධාන වලට අනුකූලව ජාත්‍යන්තර මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වෙළඳාමට බලපාන ප්‍රමිතීන් කොතෙක් දුරට යෝග්‍ය ද යන්න සොයා බැලීම රාජ්‍යයන් සතු වගකීමකි:

11.3.7 අදාළ ජාතික ආයතන හා ජාත්‍යන්තර සංවිධාන තුළින් ජාත්‍යන්තර මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වෙළඳාම පිළිබඳව නිවැරදි සංඛ්‍යා ලේඛන රාජ්‍යයන් මගින් ඒකරාශි කොට, කලට වේලාවට බෙදා හැර හුවමාරු කර ගත යුතුය.

11.3.8 රාජ්‍යයන් මගින් ජාත්‍යන්තර ධීවර හා ධීවර නිෂ්පාදන වෙළඳාමට අදාළ වන සේ පනවා ඇති නීති රෙගුලාසි පිළිබඳ හා පරිපාලනමය ක්‍රියා පටිපාටීන්හි සිදුකරන වෙනස්කම් පිළිබඳව අප්‍රමාදව ඒ ගැන උනන්දුවක් දක්වන රටවලටත් ලෝක වෙළඳ සංවිධානයටත්, වෙනත් ජාත්‍යන්තර සංවිධානවලටත් අදාල රජයයන් මගින් අප්‍රමාදව දන්වා හැරිය යුතුය.

## 12 වන වගන්තිය

## ධීවර පර්යේෂණ

12.1 ධීවර කළමනාකරුවනට හා වගකීමක් සහිත ධීවර කර්මාන්තය ගැන උනන්දුවක් දක්වන වෙනත් පාර්ශවයන්ට තීරණ ගැනීමට සහය වීමට ශක්තිමත් විද්‍යාත්මක පදනමක අවශ්‍යතාවය රාජ්‍යයන් හැඳිනගත යුතු වේ. එබැවින් ධීවර කර්මාන්තයට අදාල සියළු අංශයන්හි එනම් පෝෂණ විද්‍යාව, සමාජ විද්‍යාව, ආර්ථික හා පාරිසරික විද්‍යා, ජලදීී විගාව්, තාක්ෂණය සහ ජීව විද්‍යාව යන විෂයයන් යටතේ සුදුසු පර්යේෂණ කටයුතු සිදු කරන බවට රාජ්‍යයන් සහතික විය යුතුය. සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්ගේ විශේෂිත අවශ්‍යතා සැළකිල්ලට ගෙන පර්යේෂණ පහසුකම් සළසා දිය යුතුවා සේම සුදුසු පුහුණු කාර්ය මණ්ඩලය හා ආයතන ගොඩනැගීමද අදාල රාජ්‍යයන් විසින් කළ යුතුය.

12.2 අවශ්‍ය ව්‍යවහාරික පර්යේෂණ කටයුතු තීරණය කිරීමටත්, ඒවා යෝගය පරිදි උපයෝගී කර ගැනීමටත් හැකිවන සේ ආයතනික රාමුවක් ගොඩනැගීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

12.3 පර්යේෂණ කටයුතු තුලින් උත්පාදනය කරන ලද දත්ත විශ්ලේෂණය කර එහි ප්‍රතිපල ප්‍රකාශ කොට ( සුදුසු විටදී රහස්‍යමය ස්වරූපයට ගරු කරමින්) කළට වේලාවට සහ පැහැදිලිව අවබෝධ කර ගත හැකි පරිදි මුද්‍රණය කර බෙදා දිය යුතුය. මෙහි අරමුණ, සංවර්ධනයට, කළමනාකරණයට හා ධීවර සංරක්ෂණයට යෝග්‍යතම විද්‍යානුකූල සාක්ෂ්‍ය ලැබීමට ඉඩ සකසා දීමයි. ප්‍රමාණවත් විද්‍යාත්මක තොරතුරු නොමැති නම් යෝග්‍ය පර්යේෂණ කටයුතු හැකි විගස දියත් කළ යුතුය.

12.4 පරිසර පද්ධතියේ හා ධීවර කර්මාන්තයේ ගුණාත්මක බව තක්සේරුවට අවශ්‍ය වන විශ්වාසදායක හා නිවැරදි දත්ත රැස්කල යුතුය. මෙහිදී අපතේ යන හෝ ඉවත ලන අවශ්‍ය නොවන මසුන් ඇල්ලීම, පිළිබඳ විශ්වාසදායක

නිවැරදි දත්ත රාජ්‍යයන් ඒකරාශි කළ යුතු වේ. සුදුසු පරිදි සුදුසු කාලසීමා හා විවිධ මට්ටම්වලදී මෙම දත්ත අවශ්‍යවූ විටදී අදාළ රාජ්‍යයන්ට කලාපීය, උප කලාපීය හා ජාත්‍යන්තර ධීවර ආයතනයන්ට ලබාදිය යුතුය.

12.5 තම බල ප්‍රදේශය තුළ පවතින මත්ස්‍ය ගහනයන් කුමන තත්වයක ඇත්ද කියා රාජ්‍යයන් අධීක්ෂණ කළ යුතුය. මෙහිදී සැලකිය යුතු කරුණු අතර ධීවර කටයුතු නිසා ඇතිවන පීඩනයේ ප්‍රතිඵලයක් වන පරිසර පද්ධතියේ වෙනස්වීම් හා ඉන් සිදුවන බලපෑම්, දූෂණය වීම්, පෙර පාරිසරික වෙනස්කම් මෙයට ඇතුළත් විය යුතුය. මෙහිදී මත්ස්‍ය ගහණය හෝ ජලජීවී පරිසර පද්ධතියට දේශගුණික හා පාරිසරික වෙනස්වීම් මගින් සිදුවිය හැකි හානිය තක්සේරු කළ හැකි පර්යේෂණ හැකියාවක් සහිතවීමද අවශ්‍යය.

12.6 පිළිගත් විද්‍යාත්මක ප්‍රමිතීන් වලට ලගාවිය හැකි පරිදිත්, ජාතික පර්යේෂණ හැකියාවන් ශක්තිමත් කිරීම උදෙසාත් රාජ්‍යයන් සහය විය යුතුය.

12.7 අදාළ ජාත්‍යන්තර සංවිධාන හා සහයෝගයෙන්, ධීවර සම්පත් ප්‍රශස්ත මට්ටමින් උපයෝගී කර ගැනීම සහතික කරන පර්යේෂණ දිරිමත් කළ යුතු අතරම, මත්ස්‍ය සම්පත් ආහාරයට ගැනීමේ අදාළ ජාතික ප්‍රතිපත්ති උත්තේජ කරන අධ්‍යනයන් දිරිගැන්වීමට ද රාජ්‍යයන් පියවර ගත යුතුය.

12.8 ජලජ පරසරයෙන් සපයා ගන්නා මනුෂ්‍ය ආහාර පාරිභෝගිකයන්ගේ සෞඛ්‍යයට අහිතකරව බලනොපාන ආකාරයේ පර්යේෂණ පැවැත්වීමත් ඒවා අධීක්ෂණයත් රාජ්‍යයන් විසින් කළ යුතුය. මේවායේ ප්‍රතිපල ජනතාවට ලබාගත හැකි පරිදි සැකසීමටද පියවර ගත යුතුය.

12.9 ධීවර කර්මාන්තයේ සමාජ, ආර්ථික, ආයතනික, අලෙවි අවස්ථා ගැන ප්‍රමානවත් පර්යේෂණ කටයුතු සිදුකිරීම පිළිබඳ රාජ්‍යයන් සහතික විය යුතුය. ඉන් ලබා ගන්නා දත්ත මගින් සංසන්දනාත්මක අධීක්ෂණයට, විශ්ලේෂණයට හා ප්‍රතිපත්ති සැකසුමට උපයෝගී කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

12.10 ඉලක්ක මත්ස්‍ය වර්ග හා ඉලක්ක නොවන මත්ස්‍ය වර්ගයන්ට කුමන අන්දමට තෝරා ගත් දැල් ආම්පන්න බලපාන්නේද කියා රාජ්‍යයන් අධ්‍යයනය කළ යුතුය. ඉහත දැල් ආම්පන්න මගින් ඉලක්ක මත්ස්‍ය වර්ග හා ඉලක්ක නොවන මත්ස්‍ය වර්ග වල හැසිරීමට හා පරිසරයට ඇති කරන බලපෑම අධ්‍යයනය කරන අතරම කළමනාකරණ තීරණ ගැනීමට සහාය වීමටත්,.උපයෝගි කර නොගන්නා මත්ස්‍ය සම්පත් අවම කිරීමේ අදහසිනුත්, ජලජ පරිසර පද්ධතිය හා ජෛව විවිධත්වය ආරක්ෂා කරනු සඳහාත්, මෙම තොරතුරු උපයෝගි කර ගත යුතුය.

12.11 වෙළඳපොලේ බහුල විය හැකි නව දැල් ආම්පන්න හඳුන්වාදීමට ප්‍රථම එවැනි උපකරණ ධීවර කර්මාන්තයට හා පරිසර පද්ධතීන්ට කුමන අන්දමට බලපාන්නේද යන්න පිළිබඳව විද්‍යාත්මක ඇගයීමක් කළ යුතුය. එසේම ඒවා භාවිතා කරන්නේ කිනම් ප්‍රදේශයන්හිද කියා රාජ්‍යයන් සහතික විය යුතුය. එසේම මෙම ආම්පන්න හඳුන්වාදීමෙන් ඇතිවන බලපෑම පිළිබඳව අධීක්ෂණය කළ යුතුය.

12.12 තිරසාර ධීවර සංරක්ෂණය, කළමනාකරණය හා සංවර්ධනය උදෙසා පාරම්පරික ධීවර දැනුම හා තාක්ෂණය (විශේෂයෙන් කුඩා පරිමාන ධීවර කටයුතු පිළිබඳ දැනුම) හා භාවිතය පිළිබඳ තක්සේරු කර ලබා ගත් අවබෝධය රාජ්‍යයන් විසින් පරීක්ෂා කොට ලේඛන ගත කළ යුතුවේ.

12.13 පර්යේෂණ ප්‍රතිපල, කළමනාකරණ අරමුණු ඉටුකර ගැන්මේ පදනමක් වශයෙන් හා ඊට අදාල වන කාර්ය දර්ශක, නිර්ක්ෂක කරුණු පිළිබඳ තොරතුරු සොයා බලා වැදගත් විස්තර ලබා ගැනීම වැනි කරුණුද මේ සඳහා එක් කර ගැනීමට රාජ්‍යයන් උනන්දු විය යුතුය. මෙහිදී ව්‍යවහාරික පරීක්ෂණ හා ධීවර කළමනාකරණය අතර ප්‍රමාණවත් සබඳතාවයක් පැවැත්වීම මෙහිදී සහතික විය යුතුය

12.14 වෙනත් රාජ්‍යයන් හි මුහුදු සීමාවන් හි විද්‍යාත්මක පර්යේෂණ දියත් කරන රාජ්‍යයන්, එකී රාජ්‍යයේ යාත්‍රාවන්ට අදාලවන නීතිරීති වලට හා ජාත්‍යන්තර නීති වලට අනුකූලව පර්යේෂණ දියත් කිරීම සහතික විය යුතුය.

12.15 ගැඹුරු මුහුදේ ධීවර පර්යේෂණ කටයුතු සඳහා ඒකීය (සැමට සාධාරණ වු ) මාර්ගෝපදේශ සැපයීමට හා අනුමත කර ක්‍රියාත්මක කිරීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

12.16 පර්යේෂණ හා ඒ සඳහා ඒකීය වූ මහපෙන්වීම් සැකසීමටත්, පර්යේෂණ සඳහා සහාය දැක්වීම හා මෙම පර්යේෂණ උපකලාපීය , කලාපීය මට්ටමින් හුවමාරු කිරීමේ යාන්ත්‍රණයක් සැකසීමටත් රාජ්‍යයන් පියවර ගත යුතුය.

12.17 සෘජුව හෝ වෙනත් අන්දමට අදාල ජාත්‍යන්තර සංවිධානයන්ගේ සහයෝගයද ඇතිව රාජ්‍යයන් විසින් දේශ සීමා හරහා සංක්‍රමණය වන මත්ස්‍ය ගහණයන්හි ජීව විද්‍යාව පරිසරය හා ගහනයේ තත්වයේ අවබෝදය වර්ධනය වන අයුරින් සහයෝගීතාවය සහිතව තාක්ෂණික හා පර්යේෂණ දියත් කල යුතුය.

12.18 සංවර්ධනය වන රටවලට, සංරක්ෂණ ක්‍රියාවන්හි කාර්යක්ෂමව සහභාගිවීමටත්, කළමනාකරණ කටයුතු වලට හා සජීවි ජලජ සම්පත්හි තිරසාර භාවිතය උදෙසාත්, මානව සම්පත් සංවර්ධනය හා පර්යේෂණ පහසුකම් විධි විධාන සැකසීමට පහසුවන සේ දත්ත රැස්කිරීම, විශ්ලේෂණය, තොරතුරු හුවමාරුව යන ක්ෂේත්‍ර වල වර්ධනය සඳහා රාජ්‍යයන් හා අදාල ජාත්‍යන්තර සංවිධාන සහය විය යුතුය.

12.19 ස්වකීය දක්ෂතා හා මූල්‍යමය පහසුකම් ඇති ජාත්‍යන්තර සංවිධාන සුදුසු පරිදි මත්ස්‍ය තොග තක්සේරුව සඳහා පර්යේෂණ හා අදාල පරීක්ෂණ කටයුතුවල යෙදී සිටින රාජ්‍යයන් හට ඉල්ලුම පරිදි තාක්ෂණ

හා මූල්‍යමය ආධාර සපයා දිය යුතුය. මෙම පර්යේෂණ විශේෂයෙන් ඉලක්ක විය යුත්තේ මීට ප්‍රථමයෙන් මත්ස්‍ය අස්වැන්න නෙළා නොගත් හෝ සුළු වශයෙන් මත්ස්‍ය අස්වැන්න නෙලාගත් ප්‍රදේශ වල මත්ස්‍ය ගහණයන් ඇගයීමට ලක් කිරීමටය.

12.20 අදාල තාක්ෂණික හා මුල්‍යමය සංවිධාන පරීක්ෂණ කටයුතු සඳහා තාක්ෂණික හා මුල්‍යමය සහාය ලබාදීමේදී සංවර්ධනය වන රටවලට විශේෂ අවධානයක් යොමුකල යුතු අතර, ඒ අතරිනුත් අවම සංවර්ධිත රටවල් වලට හා සංවර්ධනය වෙමින් පවතින කුඩා දුපත් වලට වැඩි අවධානයක් යොමු කල යුතුය.

